# නියමුවා

“සෑම විප්ලවයකින්ම අති විශාල ජන සංඛ්‍යාවක ජීවිත තුළ තියුණු වෙනස්කම් ඇති කෙරෙන්නේය. එවැනි වෙනසක් ඇති වීමට කල් යල් මෝරා තිබේ නම් මිස, නියම විප්ලවයක් සිදු විය නොහැකිය. එසේම, පුද්ගලයෙකුගේ ජීවිතයේ සිදුවන ඕනෑම වෙනසක් ඔහුට බොහෝ දේ උගන්වන, සාරවත් අත්දැකීම් ලබා දෙන සහ බලවත් චිත්ත වේගාත්මක කුහුල් කම් ගෙන එන ලෙසටම, විප්ලවද, කෙටි කාලයක් තුළ මුළු ජනතාවටම සාරවත් හා අගනා පාඩම් උගන්වයි.”

ලෙනින්
තෝරාගත් කෘති,
05 වැනි වෙළුම, 189 පිටුව

ISSN 1391 - 1031 | 2023 මැයි | 27 වෙළුම | 09 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=






# රතු මැයි දින සැමරුමට දැවැන්ත ජන බලයක්

යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# ජනතා විමුක්ති පෙරමුණේ මැයි දින පණිවිඩය

# ආණ්ඩුවේ ජන පීඩනයට එරෙහිව ජනතාව දැනුවත් කෙරේ



PTA-ATA ඇතුළු ජන පීඩක ත්‍රස්ත පනත් අහෝසි කරනු!, ජාතික සම්පත් විකිණීම නවතනු!, ජීවන වියදමට සරිලන දීමනාවක් ලබාදෙනු!, අසාධාරණ ජන පීඩක බදු ක්‍රමය අහෝසි කරනු!, රාජ්‍ය මර්දනය නවතනු! යන සටන් පාඨ මුල්කරගෙන රනිල් රාජපක්ෂ ආණ්ඩුවේ ජනපීඩක පාලනයට එරෙහිව ජනතාව දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා බෙදීමේ වෘත්තීය ක්‍රියාමාර්ගයක් පසුගියදා වෘත්තීය සමිති එකමුතුව මගින් කොළඹදී ක්‍රියාත්මක කළේය.

මේ අවස්ථාව සඳහා වෘත්තීය සමිති නායකයෝ රැසක් සහභාගි වූහ. කොළඹ කොටුව, දෙමටගොඩ, නාරාහේන්පිට, සෙත්සිරිපාය, ඉසුරුපාය, මහලේකම් කාර්යාලය, මරදාන ආදී ස්ථාන රැසකම මෙම අත්පත්‍රිකා බෙදාහැරීමේ ක්‍රියාමාර්ගය පැවැත්විණි. එසේම මෙම ජනතාව දැනුවත් කිරීම රට පුරා සිදු කිරීමට කටයුතු කරන බවද වෘත්තීය සමිති එකමුතුව පවසයි.

# නාස්තියට විරෝධය - සමෘද්ධි නිලධාරීහු අවුරුදු උත්සව වර්ජනය කරති




සමෘද්ධි සේවකයින් හට බලපා ඇති සේවක ඉල්ලීම් හා සමෘද්ධි අරමුදලින් රු ලක්ෂ 816ක අතිවිශාල මුදලක් රටේ දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින මේ මොහොතේ වියදම් කර සමෘද්ධි අවුරුදු උත්සව පැවැත්වීමට විරෝධය පළ කරමින් වෘත්තීය සංගම් 10ක් විසින් සමෘද්ධි අවුරුදු උත්සව පැවැත්වීම වර්ජනය කිරීම පසුගිය අප්‍රේල් 22 දින සිදු කළ බව සමෘද්ධි වෘත්තීය සමිති එකමුතුව පවසයි.

එමෙන්ම මෙම විරෝධතාවයන් සඳහා ආණ්ඩුව යහපත් ප්‍රතිචාරයක් නොදක්වන්නේ නම් රටේම සමෘද්ධි ප්‍රජාව සම්බන්ධ කරගනිමින් දැවැන්ත අරගලයකට සූදානම් බවද මෙම වෘත්තීය සමිති එකමුතුව කියා සිටී. සාධාරණ සේවක ඉල්ලීම් හා සමෘද්ධි අරමුදල සුරැකීම වෙනුවෙන් ගන්නා ලද වෘත්තීය ක්‍රියාමාර්ගය කඩාකප්පල් කිරීමට පාලනාධිකාරිය විශාල උත්සහයක් ගෙන අවසානයේ පරාජය භාර ගනිමින් අප්‍රේල් 30 දින තෙක් අවුරුදු උත්සව පැවැත්විය හැකිය ැයි ලිපියක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති බව එම එකමුතුව පවසා සිටී. සමෘද්ධි කළමනාකරුවන් වෙත විශාල බලපෑමක් පාලනාධිකාරිය විසින් සිදු කළද දිවයින පුරා සමෘද්ධි අවුරුදු උත්සව පැවැත්වීම වර්ජනය කිරීම සාර්ථකව සිදුකළ බවද සමෘද්ධි වෘත්තීය සමිති එකමුතුවේ ප්‍රධාන සංවිධායක චාමර මද්දුමකළුගේ සහෝදරයා නියමුවා වෙත පැවසීය.

# මර්දනයට හා පීඩනයට එරෙහිව පුළුල්තම ජනතා ව්‍යාපාරය ඇරඹේ



රනිල්-රාජපක්ෂ ආණ්ඩුවේ මර්දනයට හා ජන පීඩනයට එරෙහිව ඉතිහාසයේ පුළුල්තම ජනතා ව්‍යාපාරය පසුගියදා කොළඹදී ආරම්භ කෙරුණු අතර වෘත්තීය සමිති, වෘත්තීයවේදීන් ඇතුළු භික්ෂුන් වහන්සේලාද, නීතිඥ සංගම්, ශිෂ්‍ය, කලා, ධීවර, ගොවි, කාන්තා සංගම් නියෝජිතයින් ඇතුළු සිවිල් සංවිධාන හා බහුජන සංවිධාන රැසක නියෝජිතයෝ විශාල පිරිසක් මේ සඳහා සහභාගි වූහ.

'ජනපීඩක ත්‍රස්ත පනත් අහෝසි කරනු, ජාතික සම්පත් විකිණීම නවතනු, අසාධාරණ ජන පීඩක බදු ක්‍රමය අහෝසි කරනු, උද්ධමනයට සරිලන ජීවන වියදම් දීමනාවක් ලබාදෙනු, විදුලි බිල අඩුකරනු, රාජ්‍ය මර්දනය වහා නවතනු' යන සටන්පාඨ මූලික කර ගනිමින් මෙම නියෝජිත හමුව කොළඹ බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේදී පැවැත්විණි.

# ජල සමිති වෘත්තීය ක්‍රියාමාර්ගය ජයග්‍රහණයෙන් අවසන්

ජල සම්පාදන සේවකයින් පසුගිය අප්‍රේල් 04 දින සිට ගත් අඛණ්ඩ වෘත්තීය ක්‍රියාමාර්ගය ජයග්‍රහණයෙන් අවසන් කිරීමට හැකි වූ බව ජල සම්පාදන වෘත්තීය සමිති ඒකාබද්ධ සන්ධානයේ සම කැඳවුම්කරු ඉංජිනේරු උපාලි රත්නායක සහෝදරයා පවසයි.

ජල සම්පාදන සේවකයින් මාර්තු 01 දින සිට තමන්ගේ ඉතිරි වෛද්‍ය නිවාඩුවලට ගෙවීම් අහිමි කිරීමට එරෙහිව වෘත්තීය ක්‍රියාමාර්ගයවලට එළඹ සිටි අතර බලධාරීන්ගෙන් නිසි ප්‍රතිචාරයක් නොලැබීම නිසා අප්‍රේල් 04වැනිදා සිට අඛණ්ඩ වෘත්තීය ක්‍රියාමාර්ගයක් ගන්නා ලදී.

04වැනිදා ආරම්භ කරන ලද වෘත්තීය ක්‍රියාමාර්ගයේදී සියලු කාර්යාල සේවා සහ පාරිභෝගික සේවාවලින් ඉවත් වූ අතර ජල පොම්පාගාරවල කටයුතු පමණක් ඉටුවිය. එදින ආරම්භ කළ වෘත්තීය ක්‍රියාමාර්ගය අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර අප්‍රේල් 06 දින පස්වරුවේ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සනින් ලබාදුන් ලිඛිත අනුමැතිය අනුව එම ඉල්ලීම් ඉටුවීම නිසා වෘත්තීය ක්‍රියාමාර්ගය 07වැනිදා සිට අවසන් කරන ලද බව උපාලි රත්නායක සහෝදරයා පවසයි.



ලංකාවේ වැඩකරන ජනතාව ප්‍රමුඛ, පීඩිත පොදු ජනතාව මෙවර 2023 ජාත්‍යන්තර කම්කරු දිනය සමරන්නේ ඉතිහාසයේ ඉතාමත් තීරණාත්මක කඩඉමක සිටය.

ලෝක ධනවාදය තුළ අධිරාජ්‍යවාදී උපායමාර්ග තුළ නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය යළි යළිත් අසාර්ථක වී, ධනවාදී ලෝකයම බරපතළ අර්බුදයන්ට මුහුණ දී සිටී. එකී අර්බුදය දැන් ඉල්ලා සිටින්නේ සමාජයේ සරල වෙනස්කම් නොව සමාජ ආර්ථික දේහයේ ගැඹුරු වෙනස්කම්ය. සමාජ පරිවර්තනයක්ය.

ලංකාවේද වසර 75ක ධනේශ්වර තට්ටුමාරු දේශපාලන ගමනක අවසානයේ ලංකාව පත්ව සිටින්නේ සමාජ, ආර්ථික, දේශපාලන ඛේදවාචකයකටය. ණය බරින් මිරිකී, ගත් ණය ගෙවාගත නොහැකිව නිල වශයෙන්ම බංකොලොත් බව ප්‍රකාශ කළ රටක ජනතාවෝ, මූලික ජීවන කොන්දේසි පවා ඉටුකර ගැනීමට නොහැකි වීමෙන් පීඩාවෙන් පීඩාවට පත්ව සිටිති.

රටේ වැඩකරන ජනතාව, ගොවි ජනතාව, ධීවර ජනතාව, තරුණයින්, කාන්තාවන්, සිසුන් පමණක් නොව නිෂ්පාදකයන්, සුළු පරිමාණ ව්‍යාපාරිකයන්, විවිධ වෘත්තීන්හි නිරත වන්නන් ආදී සමාජයේ සාතිශය බහුතරයක් ජනයා වත්මන් ආර්ථික අර්බුදයේ ඛේදවාචකයෙන් පීඩාවට පත්ව ඉන් මිදීමේ මඟක් සොයමින් සිටිති.

මේ මොහොතේ රටේ පාලන බලයේ සුක්කානම අතට ගෙන සිටින, ජනවරමක් නැති විධායක ජනාධිපති රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ පාලක නඩය මේ ව්‍යසනයට මුවා වී රට අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රයට අනුව හැසිරවීමට පටන් ගෙන තිබේ. ණය බරින් මිරිකී බංකොලොත් වූ රටක, ඊට හේතු වූ වංචා, දූෂණ, නාස්තිය නතර කර, රට නිෂ්පාදන ආර්ථික උපායමාර්ගයකට යොමු කරනවා වෙනුවට රනිල් වික්‍රමසිංහ පියවර ගෙන ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගන්නා තවත් ණයක් වෙනුවෙන් රට පාවා දීමටය. මූල්‍ය අරමුදලේ කොන්දේසිවලට යටවී රටේ අවසාන සම්පත් ටිකත් විකුණමින් ජනතාව මත අධික ලෙස බදු බර පටවමින් තවත් ටික දවසක් හෝ බලයේ රැඳී සිටීමටය.

අනෙක් අතට රට පාවාදෙමින්, ජනතාව මත බර පටවමින් යන අධිරාජ්‍ය ගැති පාලනයට එරෙහිව නැගෙන ජනතා විරෝධයන් යටපත් කිරීමට, මර්දනය කිරීමට නව ත්‍රස්ත විරෝධී පනත් හඳුන්වාදීමටත් ජනතාව බිය වැද්දීමටත් ජන මතයට බියෙන් ඡන්ද කල්දැමීම වැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී ඒකාධිපති පන්නයේ ගමනකටද රනිල් වික්‍රමසිංහ පාලනය විසින් මුල පුරනු ලැබ ඇත.

එහෙත් මෙවර 2023 මැයි දිනය සමරන මොහොතේ රට පවතින්නේ පාලකයන් සිතන ආකාරයට නොවේ. මෙරට ජනයා දැන් දේශපාලනික වශයෙන් වඩාත් සවිඥානික වී සිටිති. මේ විපතින් රට ගොඩගැනීමට නම්, නිෂ්පාදන ආර්ථික ක්‍රමයකට රට ගෙන යා යුතු බවටත් සමාජ සාධාරණත්වය ඇති කළ යුතු බවටත් වංචා, දූෂණ, හොරකම් ස්ථිර ලෙස නවතා සියලු හොරුන්ට අපරාධකරුවන්ට දඬුවම් දිය යුතු බවටත් හොරා කෑ මහජන ධනය යළි අත්පත් කර ගත යුතු බවටත්, ඒ සඳහා ජනතාවගේ පාලනයක් බිහිකළ යුතු බවටත් දැන් බහුතර ජනතාව තදින් විශ්වාස කරති.

රට විනාශ කළ, එම විනාශකාරී මාවතේම තවදුරටත් අගාධය කරා, රට ඇදගෙන යන බලලෝභී, ජනපීඩක, දුෂ්ට පාලනයත් 75 වසරක බංකොලොත් තට්ටුමාරු දේශපාලන ක්‍රමයත් වහාම පරාජය කොට, බිඳවට්ටන ලද මව්බිම ගොඩනඟන ජනතාවාදී පාලනයක් බිහිකිරීම හැර අන් විකල්පයක් වැඩකරන ජනතාව ප්‍රමුඛ පොදු ජනයා ඉදිරියේ දැන් නැත.

එබැවින් රට විකුණන, රට පාවාදෙන, ජන පීඩක, දූෂිත ප්‍රභූ පංතියේ පාලනය පරාජය කොට ජනතාවාදී පාලනයක් ගොඩනැංවීම සඳහාත් දැනට ජනවරමකින් තොරව බලහත්කාරයෙන් බලයේ සිටීමට වෙර දරන ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලක කල්ලිය පැරදවිය හැකි දැවැන්ත ජනතා බලය ගොඩනැඟීම සඳහාත් ධෛර්යයෙන් හා අධිෂ්ඨානයෙන් පෙරට එන ලෙස වැඩකරන ජනතාව ප්‍රමුඛ වර්තමාන ඛේදවාචකයෙන් පීඩාවට පත්ව සිටින සියලු ජනතා බලවේගයන්ගෙන් මේ මැයි දිනයේදී අපි ඉල්ලා සිටිමු.

**දේශපාලන මණ්ඩලය**
**ජනතා විමුක්ති පෙරමුණ**
**2023.05.01**

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ඉතිහාසයේ එකම දේ යළිත් සිදුවෙයිද?

"'ලෝක ඉතිහාසයේ ඉතා වැදගත් සිද්ධීන් හා පෞරුෂත්වයන් දෙවරක් ඇතිවන බව කිව හැකියි', හෙගල් වරක් පැවසීය. එහෙත් ඔහුට මෙලෙස එකතු කිරීමට අමතක විය; 'ඒවා ඇතිවන්නේ පළමුවරට ඛේදජනකයක් ලෙසත්, දෙවන වර හාස්‍යජනකයක් ලෙසත්ය.'" යනුවෙන් වරක් මාක්ස් පැවසීය.

වර්තමානයේ ලංකාවේ දේශපාලනය දෙස බලන විටද මෙය මෙසේදැයි සිතේ.

ලංකාව කොල්ලකාරී විවෘත ආර්ථිකයට ගැටගසනු ලැබුයේ 1978 කාලයේදී එවකට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනය. කොල්ලකාරී විවෘත ආර්ථිකය ක්‍රියාවට නැංවීම සඳහා ජයවර්ධන එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී කඳවුරේ සරණ ගියේය. අතීතයේ සිටම ඔහු හඳුන්වනු ලැබුවේද 'යැංකි ඩිකී' යන නමිනි. විවෘත ආර්ථිකය තුළ කම්කරු අයිතීන් අහිමි කිරීමට සිදුවන විට, රටේ සම්පත් විකුණා දමන විට, රට අධිරාජ්‍යවාදී තිප්පොළක් කරන විට අනිවාරණීය ලෙසම මතුවන ජනතා විරෝධයන් මැඩ පැවැත්වීමට ඔහු පියවර රැසක් ගත්තේය.

අධිබලැති ජනාධිපති ධුරයක් සහිත ඒකාධිපති ව්‍යවස්ථාවක් හැදීම, 1979දීම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්මත කර ගැනීම, වෘත්තීය සමිති මර්දනය කිරීම හා වැඩවර්ජන මර්දනය කිරීම, ආණ්ඩු විරෝධීන්ට පහර දීමට මැර හමුදාවක් (තග් සංස්ථාව) පවත්වාගෙන යමින් සමාජය භීතියට පත්කිරීම, ඡන්ද කල් දැමීම, දේශපාලන පක්ෂ තහනම් කිරීම, අධිකරණයට අත පෙවීම ආදී ප්‍රජාතන්ත්‍ර විරෝධී, මානව විරෝධී ඒකාධිපති ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී. එම ක්‍රියාමාර්ග අවසානයේ රට රැගෙන යනු ලැබුයේ මහා ඛේදවාචකයකටය.

ඉතිහාසයේ වරක් සිදුවූ එම සිදුවීම නැවත ඇති කිරීමට වර්තමානයේද උත්සාහයක් පවතී. එහි පෙරමුණ ගෙන සිටින්නේ ජේ.ආර්.ගේ බෑනා වූ රනිල් වික්‍රමසිංහය.

ජයවර්ධනට අවසන් කිරීමට නොහැකි වූ කොල්ලකාරී විවෘත ආර්ථිකය හෙවත් නව ලිබරල්වාදයේ ඉලක්ක අවසන් කිරීම දැන් රනිල් භාරගෙන තිබේ. ඒ සඳහා ඔහු මාමාගේ අඩිපාරේ යන්නට උත්සාහ කරන බවද පෙනේ.

පසුගිය කාලයේ රට තුළ ඇති වූ අතිශය සංකීර්ණ ආර්ථික හා දේශපාලන අර්බුදය තුළ අහම්බෙන් ජනාධිපති ධුරයට පත්, ජනවරමක්ද නැති රනිල් වික්‍රමසිංහ මාමාගේ අඩිපාරේ යනු ඇතිද යන ප්‍රශ්නය අප ඉදිරියේ තිබේ.

දැන් රනිල් වික්‍රමසිංහද සාමකාමී උද්ඝෝෂණවලට පහරදීම අරඹා තිබේ. සාධාරණ වැඩවර්ජන හා වෘත්තීය අරගල මර්දනය කිරීමට පටන් ගෙන තිබේ. මැතිවරණ කල්දමා ජනමතයට ඉඩ අහුරා සිටී. ජයවර්ධනගේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතටත් වඩා බියකරු ත්‍රස්ත විරෝධී පනත සම්මත කර ගැනීමට රනිල් උත්සාහ කරමින් සිටී. අවසාන රාජ්‍ය දේපළද විකුණා දැමීමට තීරණය ගෙන තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණයක් වෙනුවෙන් රට යළිත් අධිරාජ්‍යවාදයේ න්‍යාය පත්‍රයට යටත් කර තිබේ.

ජේ.ආර්.ට මෙන්ම රනිල්ටද මර්දනය අවශ්‍යව ඇත්තේ ලංකාව තුළ අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේදී මතුවන බාධාවලට මුහුණ දීම සඳහාය. තම ප්‍රභූ පංතියේ බලය ගිලිහී යා නොදී තබාගැනීම සඳහාය.

ජයවර්ධන ඉතිහාසයේ ඛේදවාචකයක් නිර්මාණය කළ අතර, මාක්ස් කී පරිදිම රනිල්ට කළ හැකි වන්නේ එයම කිරීමට ගොස් ඉතිහාසයේ හාස්‍යජනක හෙවත් විගඩමක් නිර්මාණය කිරීමය. මන්ද ගෙවුණු ඉතිහාසය තුළ සමාජ බලවේගයන්ගේ තත්වය වෙනස් වී ඇති නිසාය.

එදා ජයවර්ධනට ඇති තරම් බලයක් තිබුණි. ඔහුට ඔහුගේම හයෙන් පහක පාර්ලිමේන්තු බලයක් තිබුණි. එහෙත් අද රනිල්ට එවැන්නක් නැත. පාර්ලිමේන්තුවේ එ.ජා.ප. මන්ත්‍රීවරු සිටින්නේ එක් අයෙකු පමණි. රනිල් කටයුතු කරන්නේ රාජපක්ෂලාගේ පාර්ලිමේන්තු බලයෙනි. එය එතරම් සවිමත් එකක් නොවේ. එදා ජයවර්ධනට සැලකිය යුතු මහජන සහායක් රට තුළ, රාජ්‍ය ආයතන තුළ තිබිණි. එහෙත් අද රනිල්ට රට තුළ කිසිදු මහජන සහායක්, ජන බලයක් නැත.

එදාට වඩා අද සිවිල් සමාජය ශක්තිමත්ය, ජනමාධ්‍ය පුළුල්ය. ධනපති ක්‍රමය අර්බුදයකය. ධනවාදී පක්ෂ අර්බුදයකය. ඔවුන්ට ජනතා සහායක් නැත. ඒ අතරම වමේ හා ප්‍රගතිශීලී බලවේග ජාතික ජන බලවේගය තුළ ඉතාම ශක්තිමත් තැනකට පැමිණ සිටී. ඉදිරියේ පවත්වන ඕනෑම ඡන්දයකදී ජයග්‍රහණය කරන්නේ මාලිමාව බවට සියලු ජනමත සමීක්ෂණ විසින් පෙන්වා දෙනු ලැබ තිබේ. එබැවින් ජයවර්ධන මාමා කළ හපන්කම් රනිල් බෑනාට කිරීමට හැකිවන්නේ නැත. රනිල්ගේ උත්සාහය විගඩමක් බවට පත්වන්නේ ඒ නිසාය.

කෙසේ වෙතත් ජනවරමක්ද නොමැතිව ඒකාධිපතියෙකුව අද නව ලිබරල්වාදයේ අවසන් ඉනිම ක්‍රීඩා කිරීමට සැරසෙන රනිල් ඇතුළු සමස්ත ප්‍රතිගාමීන්ගේ උත්සාහය වහාම පරාජය කළ යුතුය. ඒ, රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම්, මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු නිසාය; වසර හැත්තෑපහක් තිස්සේ විනාශ කරන ලද මේ රට යළි ගොඩනැගිය යුතු නිසාය.

ඒ සඳහා වසර 75ක ශාපකාරී දේශපාලනය, රනිල් - රාජපක්ෂ නඩය සමග පරදවා නිමා කළ යුතු වන අතර නව සමාජයක් වෙනුවෙන් ජනතාවාදී පාලනයක් ගොඩනැගීම සඳහා පෙරමුණ ගත යුතුය. මේ ඒ සඳහා අවස්ථාවය.

# විසඳුම් වෙනුවට අර්බුද හදන රනිල්

මේ මොහොතේත් ලංකාව පවතින්නේ ඉතාම විශාල, ගැඹුරු, සමාජ, ආර්ථික, දේශපාලන අර්බුදයකය. වර්තමාන අර්බුදය බලපා තිබෙන්නේ පොදු ජනතාවට පමණක් නොවේ. පාලක පංතියටද මෙම අර්බුදය බලපා තිබේ. කරුණු පෙළ ගැසී තිබෙන ආකාරයට මෙම අර්බුදයෙන් මිදීමට පාලක පන්තියට නොහැකි අතර ඔවුන්ගේ තේරීම වූ රනිල් වික්‍රමසිංහ අර්බුදය විසඳන්නා නොව අලුත් අර්බුද නිර්මාණය කරන්නා බවට පත්ව තිබේ.


පසුගිය වසරේ රනිල් වික්‍රමසිංහට ජනාධිපති ධුරය ලැබුණේ රට තුළ ඇති වූ දැවැන්ත රාජපක්ෂ විරෝධයත් සමග ගෝඨාභය රාජපක්ෂට ජනාධිපති ධුරය අත්හැරීමට සිදුවූ තත්වය තුළය. එහිදී ඒ මොහොතට අනුව තමන්ගේ පක්ෂයේ වෙනත් කෙනෙක් ජනාධිපති කළහොත් පක්ෂයේ බලය රාජපක්ෂවරුන් අතින් ගිලිහී ඔහුට යා හැකි නිසා රාජපක්ෂවරු මහජන බලයක් නැති රනිල්ට ජනාධිපතිකම දීමට තීරණය කළෝය. ඒ තම පැවැත්ම රැකගැනීම වෙනුවෙනි. එහෙත් දැන් එයම ඔවුනට පාරාවළල්ලක් වෙමින් තිබෙන බව පෙනේ.

ජනාධිපති ධුරය ලබාගත් රනිල් ඒ සමගම අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රයට අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා එක්ව රටේ ආර්ථිකය හැසිරවීම ආරම්භ කළ අතර ඉන් ලද ණය මුදල නිසාත් රටේ ආර්ථිකය හකුළා ආනයන අඩු කිරීම නිසාත්, ණය ගෙවීම් නතර කිරීම නිසාත්, තරමක් සවිමත් වූ විදේශ සංචිතය උපයෝගී කරගෙන තාවකාලික සහනයක් මවාපෑමටද කටයුතු කළේය.

ඒ අතර රනිල් දැන් කටයුතු කරන්නේ, රාජපක්ෂලා දුන් කොන්ත්‍රාත්තුව අවසන් කර, බලය යළි ඔවුන්ටම භාරදී වේදිකාවෙන් බැස යාමට නොව, ලැබුණු අවස්ථාව යොදාගෙන තම බලය දිගු කර ගැනීමටය.

සාර්ථකවීමට කිසිදු ඉඩක් නැතත් දැන් රනිල් වික්‍රමසිංහ කල්පනා කරන ක්‍රමයක් තිබේ. ඒ ඉක්මනින් ජනාධිපතිවරණයකට ගොස් තවත් වසර පහකට බලය ලබා ගැනීමය. ආර්ථිකයේ ඇතිවන කෘත්‍රිම තාවකාලික සහනදායී තත්වය පෙන්වා "වැටුණු රට ගොඩගැනීමට උරදුන් මිනිසා" ලෙස තමන්ව හඳුන්වාගෙන ඉක්මන් ජනාධිපතිවරණයකට යාම ඔහුගේ අරමුණ වී ඇත.

එහිදී ඉක්මන් ජනාධිපතිවරණයකදී රාජපක්ෂ කඳවුරේ ප්‍රබල අපේක්ෂකයෙකු නැතිවීමත්, බලය වෙනුවෙන් රාජපක්ෂ කඳවුරේ සමහරුන් රනිල් සමග පෙළගැසෙනු ඇතැයි යන විශ්වාසයත්, ස.ජ.බ. බිඳ දමා තමන් වෙතට ගත හැකිය යන තර්කයත් සමග තමන්ට වාසිසහගත තත්වයක් ඇතැයි ඔහු කල්පනා කරන බව පෙනේ. පුංචි ඡන්දය කල් දැමීමට ඒක හේතුවක් වූයේද, ඡන්දයේ ප්‍රතිඵලය තම අරමුණට බාධාකාරී යැයි ඔහු සිතන නිසාය.



එහෙත් දැන් එම සිහිනය බිඳ වැටෙමින් තිබේ. එහි ප්‍රධානතම බාධාව මතුව තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළය. ව්‍යවස්ථාවට අනුව වසර හතරකට පසු ඉක්මන් ජනාධිපතිවරණයකට යාමේ අයිතිය ලබාදී තිබෙන්නේ ඡන්දයෙන් පත්වූ ජනාධිපතිවරයාටය. අනුප්‍රාප්තික ජනාධිපතිවරයාට එම අයිතිය නැති බව ඉතා පැහැදිලිව සඳහන්ව තිබේ. එසේ නම් පවතින ව්‍යවස්ථාවට අනුව රනිල්ට ඉක්මන් ජනාධිපතිවරණයකට යා නොහැක.

ඒ සඳහා රනිල්ට ඇති විකල්පය වන්නේ ව්‍යවස්ථාව සංශෝධනය කර ගැනීමය. එහෙත් ඊට පාර්ලිමේන්තුවේ බහුතර සහාය අවශ්‍ය වේ. රනිල්ට පාර්ලිමේන්තුවේ තිබෙන්නේ එක් මන්ත්‍රී ධුරයක් පමණි. රනිල් ජනාධිපතිකම කරන්නේ රාජපක්ෂ කඳවුරේ මන්ත්‍රීවරුන්ගේ සහාය මතය. එහෙත් ඉක්මන් ජනාධිපතිවරණයක් රාජපක්ෂවරුන්ට අවාසි වන නිසා ව්‍යවස්ථා සංශෝධනයකට ඔවුන් සියලු දෙනාගේ සහාය ගැනීමට නොහැකි වනු ඇත. දැනටමත් රනිල් සමග සමීපව කටයුතු කරන අය රනිල්ට උදව් කළත් එය ව්‍යවස්ථා සංශෝධනයක් සම්මත කර ගැනීමට ප්‍රමාණවත් නොවෙනු ඇත.

තත්වය එසේ වී ජනාධිපතිවරණය පැමිණෙන්නේ නියමිත පරිදි ලබන වසර අවසානයේ නම් ඒ වන විට රනිල් - රාජපක්ෂ පාලනය විසින් දැන් කෘත්‍රිමව නිර්මාණය කර ඇති ආර්ථිකයේ මෙම සහනකාරී තත්වය මුළුමනින්ම බිඳ වැටී යළිත් විශාල අර්බුදවලට මුහුණ දීමට රටට, ජනතාවට මෙන්ම ආණ්ඩුවටද සිදුවනු ඇත.

දැනට ආණ්ඩුව තම විදෙස් සංචිත යම්තම් රැකගෙන සිටින්නේ විදේශ විනිමය උපයා ගැනීමේ, වත්කම් ඉපයීමේ වැඩපිළිවෙළක් තුළ නොවේ. එවැන්නක් පිළිබඳව ඔවුන් සිතාවත් නැත. මේ තත්වය පවතින්නේ වෙළඳපොළ හකුළා ආනයන සීමාකර ආනයන වියදම් අඩුකර ගැනීමත්, ණය නොගෙවා සිටීමත් අලුතින් ණය ගැනීම හා රාජ්‍ය සම්පත් විකුණා මුදල් ගැනීමත් වැනි කරුණු නිසාය. මෙය දිගටම පවත්වාගෙන යා නොහැක.

වෙළඳපොළ යළි සක්‍රීය කළ විගස භාණ්ඩ ආනයනය සඳහා ඩොලර් අවශ්‍ය වී ඩොලර් අර්බුදය යළි මතුවේ. ඩොලර් සඳහා ඉල්ලුම වැඩිවන විටම ඩොලරයේ වටිනාකම යළි ඉහළ යනු ඇත. අනෙක් අතට සමහර රටවල ණය කල්දමා ගැනීමද කළ හැක්කේ වසර දෙකකට පමණය. ඉන් දැනටමත් වසරක් ගෙවී තිබේ. ලබන වසරේ අප්‍රේල් වන විට යළි ණය ගෙවීමට සිදුවන විටම යළි ඩොලර් ප්‍රශ්නය මතුවේ. පසුගිය අප්‍රේල් 19 වනදාට වසර පහක් කල් පිරුණු ස්වෛරී බැඳුම්කරයට ගෙවිය යුතු ඩොලර් මිලියන 1250ක මුදල ආණ්ඩුව විසින් ගෙවූයේ නැත. එයද දැන් නොගෙවා සිටී. ඒ අනුව ජනාධිපතිවරණය ලබන අවුරුද්දේ පවත්වන්නේ නම් රනිල්ට කිසිදු වාසියක් අත්වන්නේ නැත.

අනෙක් ප්‍රධානම කරුණ නම්, මේ වන විට අපේ රටේ ජනමතයේ ඇති වී තිබෙන විශේෂ වෙනස්කමය. ජනතාව පැරණි සාම්ප්‍රදායික පක්ෂ ප්‍රතික්ෂේප කර, නව මඟක් ගැනීමට තීරණය කර තිබේ. වර්තමානයේ පළාත් පාලන ඡන්දය කල්දමා තිබෙන විටත් සමහර මාධ්‍ය ආයතන හා සමහර සංවිධාන විසින් පවත්වා ඇති ජනමත විමසුම්වලදී පළාත් පාලන ඡන්දයේදී පමණක් නොව මහ මැතිවරණයකදී හා ජනාධිපතිවරණයකදීද, ජය ගනු ඇතැයි සිතන පක්ෂය බවට ජාතික ජන බලවේගය පත්ව තිබේ. ජනාධිපතිවරණයකදී ජය ගනු ලබන අපේක්ෂකයා බවට අනුර දිසානායක සහෝදරයා පත්ව තිබේ.

මෙම තත්වය යළි බලය පහසුවෙන් තමන්ට දිනා ගැනීමේ රනිල්ගේ සිහිනය සැබෑ නොවෙන බවට ඉතා පැහැදිලිය. ත්‍රස්ත විරෝධී පනත් ගෙනෙමින් ජනතාව බියවැද්දීමටත්, ඡන්ද කල්දැමීමටත්, වෘත්තීය සමිති ක්‍රියාමාර්ග මර්දනය කරමින් කටයුතු කිරීමටත් රනිල්ට සිදුව ඇත්තේද, ඔවුන්ට දැන් කිසිදු ජන බලයක් නැති නිසාය. දැන් ඔවුන් ඉදිරිපිට ඇති එකම විකල්පය, හැකි දිනක් බලහත්කාරයෙන් බලයේ රැඳී සිටීමය.

කිසිදු පාලක පංතියක් තමන් අත ඇති බලය පහසුවෙන් විරෝධයකින් තොරව ජනතාව වෙත භාරදෙන්නේ නැත. එහෙත් ජනතාව බලවත් වූ විට, දුෂ්ට පාලකයන් පරදා බලය තමන් වෙත ගැනීමට ජනතාව තීරණය කළ විට, එය වැළැක්විය හැකි සමතෙක්ද ලොව නැත්තේය.

මෙහි තවත් පැත්තක්ද තිබේ. ඒ, රනිල්ගේ මේ ක්‍රියාමාර්ග නිසා එක් අතකින් පොහොට්ටුව බිඳී දුර්වල වීමය. දැනටමත් පොහොට්ටුවේ පිරිසක් රනිල්ට සමීපව සිටී. ඔවුන්ට දැන් ප්‍රබල නායකයෙක් නැත. මහින්ද රාජපක්ෂ අක්‍රීය වී ඇත. ඔවුනට ජනතා සහායද නැත. දැන් එකම විසඳුම ලෙස බැසිල් පෙරට ගැනීමට සමහරු සිතුවත් එයද පහසු නොවේ. පොහොට්ටුව දැන් කැලිවලට කැඩී ගිය දුර්වල සංවිධානයක් වන අතර පළාත් පාලන මන්ත්‍රීවරු, පළාත් සභා මන්ත්‍රීවරු නැතිවීම ඔවුන්ගේ බිම් මට්ටමේ සංවිධාන යාන්ත්‍රණය තවත් දුර්වල කිරීමට හේතු වී තිබේ.

ස.ජ.බ.යද පවතින්නේ කැඩී යාමේ අනතුරක් ළඟය. එහි පිරිසක් ඇමතිකම් වෙනුවෙන් රනිල් වෙත යාමට සූදානම්ය. තවමත් නොයාමේ හේතුවද එන හැමටම දීමට තරම් ඇමති ධුර නොවීමය. ස.ජ.බ.ය දැන් අර්බුදයට ගොස් ඇති අතර, එයට තිබූ ජනතා ප්‍රසාදයද අඩුවෙන්නට පටන්ගෙන තිබේ.

ඇත්තටම පසුගිය වසරේ ඇති වූ ජනතා නැගිටීමට මුහුණ දී අර්බුදයෙන් මිදීමට පාලක පංතිය තෝරාගත් විසඳුම වූ රනිල් දැන් ඔවුන්ටම කරුමයක් වෙමින් තිබේ. ස.ජ.බ.ය බෙදෙන්නේද පොහොට්ටුව බෙදෙන්නේද රනිල් කේන්ද්‍රකොට ගෙනය. මේ තත්වය මත පැරණි සාම්ප්‍රදායික දේශපාලනයේ අවසානයත් නව දේශපාලන බලවේගයක් ලෙස ජාතික ජන බලවේගයේ ජයග්‍රහණයත් කිසිවෙකුටත් වැළැක්විය නොහැකි වෙනු ඇත.



YES WE CAN

# ජයග්‍රහණය වෙනුවෙන් සටන!

ලාංකේය ඉතිහාසය පුරාවට පීඩිත පංතියට කුඩා කුඩා ජයග්‍රහණ හැරෙන්නට අවසන් ජයක් ලබාගැනීමට නොහැකි වී ඇත. එම අවසන් ජයග්‍රහණය වෙනුවෙන්, පීඩාවට පත් පංතිය කණ්ඩායමක් ලෙස එකට එක්කාසු වීද නොමැත. මේ නිසාම පාලක පංතිය විසින් ගෙවුණු ඉතිහාසය පුරාම තමන්ගේ ජයග්‍රහණය සටහන් කරනු ලැබ ඇත. එම ජයග්‍රහණවලින් උපරිම ප්‍රයෝජන ගත් කොල්ලකාරී දූෂිත පාලකයෝ අපේ රට අද පත්ව ඇති තත්වය දක්වා විනාශ කර දමා සිටිති.

අප මේ ගෙවමින් ඇති, එකී විනාශයේ අවසන් හෝරා කිහිපයේ, පීඩිත පංතියේ යම් හිස එසවීමක් දක්නට ඇත. එයද යම් සීමාවක කොටු වූ හිස එසවීමකි. පාලක පංතිය විසින්ම නිර්මාණය කරන ලද ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන මැතිවරණ සීමාව තුළට මෙම හිස එසවීම සීමා වී ඇත. එහි වාසිය හැමදාමත් මෙන් පාලක පංතිය විසින් ප්‍රයෝජනයට ගනිමින් ඇත.

ඉතිහාසයෙන් උගත යුතු පාඩම් බොහෝය. ධනේශ්වර පාලක පංතියට අවාසිදායක කිසිදු මොහොතක මැතිවරණ නොපවත්වන බවට ඉතිහාසය තුළ සාක්ෂ්‍ය එමටය. ලෝකයේ කිසිදු රටකින් තම පංතිය අතැ'ති බලය, සාධාරණ මැතිවරණයක් පවත්වා අතහැර ගිය ධනේශ්වර පැලැන්තියක් අපට හමු වී නැත. එතරම් කරුණාබරිත ධනපතීන් ඉතිහාසය තුළ නිර්මාණය වීද නොමැත.

අප උගත් පාඩම් එසේ වෙද්දී අනාගතය තුළ එවැනි කරුණාබරිත ධනපතීන් බිහි වේ යැයි සිතීමද දේශපාලන මෝඩකමකි.

මේ නිසා රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ ධනපති පාලකයින් තම පංතියේ බලය රැකගැනීම වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව දියුණු දේශපාලන දැක්මක් සහිතව අප කියවාගත යුතුය. පරාජය අභියස සිටින එම පාලකයෝ තමන්ට යොදාගත හැකි සියලු අවි, හැකි සියලු ආකාරයෙන්ම යොදාගනිමින් සිටිති. පාර්ලිමේන්තුව, අධිකරණය, පොලීසිය ඇතුලු මිලිටරි බලය, රාජ්‍ය ආයතන, මාධ්‍යය තම බලය රැකගැනීම වෙනුවෙන් යොදාගනිමින් සිටිති; නව නීති හදති; ඒ සඳහා අනුමැතියද ගනිති. එම නීති මිලිටරි බලය යොදවා සමාජය මත බලහත්කාරයෙන් මුදාහරිති. නව සමාජ තත්වය මෙසේ යැයි කියමින් එය බාරගැනීමට, පීඩිත පංතිය නැවත සූදානම් කිරීමට අවශ්‍ය සමාජ මතවාදයන්, වටපිටාවන් මාධ්‍ය මගින් නිර්මාණය කරමින් සිටිති.

අප ජීවත්වන්නේ, පාලකයා ඉතා සූක්ෂම ලෙස, ගිලිහෙමින් පවතින තම බලය, උපරිම කාලයක් රැකගැනීම වෙනුවෙන් උත්සාහ කරන කාල වකවානුවකයි. මේ නිසාම තම පංතියේ බලය උරගා බැලෙන හෝ ගිලිහිය හැකි හෝ කිසිදු මැතිවරණයකට නොයා සිටීම වත්මන් වික්‍රමසිංහ පාලනයේ උපායයයි.

ඒ අතරම මේ උදාවී ඇත්තේ පාලකයාට අවාසි සහගත, එහෙත් පීඩාවට පත් අප පංතිය වෙත බලය ලබාගැනීමේ, ජයග්‍රහණය ගෙන ඒමේ කාර්යයට පාවිච්චි කළ යුතු කාලයයි. ඒ වෙනුවෙන් සටන් කිරීම හැර වෙන විකල්පයක් නොමැති බව දැන් ප්‍රත්‍යක්ෂ වී හමාරය.

පාලකයා විසින් ලබා දෙන ඊනියා මැතිවරණ කොටුවෙන් මිදී එය වටහාගත යුතු අතර සමස්ත පීඩිත පංතියද එම ඊනියා මැතිවරණ සීමාවෙන් එළියට ගත යුතුය. ඒ අනුව පංතියක් ලෙස පීඩාවට පත් අප ශක්තිමත් වීම අනිවාර්යය වේ. අපට ඇති එකම හා ප්‍රබලම ශක්තිය නම් සංවිධානය වීමයි. මේ නිසා වැඩි වැඩියෙන් සංවිධානය වීම, සටන් කිරීම අපගේ ජයග්‍රහණයේ මාවත විවර කර දෙනු නිසැකය. ජයග්‍රහණ ඇත්තේ මැතිවරණ තුළ නම් එම මැතිවරණ දිනාගැනීමටද අප සංවිධානාත්මව සටන් කළ යුතුය. ජයග්‍රහණයට සටන් කිරීම හැර වෙනත් විකල්පයක් නොමැත!

# X press pearl වන්දිය කොල්ල කෑමට ඉඩ නොදෙමු!

X press pearl නෞකාව ගිනිබත් වීම නිසා සිදු වූ හානියට වන්දි ලබාගැනීමට ආණ්ඩුවේ මැදිහත්වීම ගැටලු සහගත වීමටත් එහිදී සිදු වූ යැයි පැවසෙන කොමිස් ගැනීමේ සිදුවීමටත් විරෝධය දක්වමින් උද්ඝෝෂණයක් කොළඹ අධිකරණ අමාත්‍යාංශය ඉදිරියේදී පසුගිය අප්‍රේල් 27වැනි දින පැවැත්විණි.

සමාජවාදී තරුණ සංගමය සහ පරිසර සංවිධාන එකතුවෙන් මෙය පවත්වන ලද අතර එය සංවිධානය කර තිබුණේ "X press pearl නෞකාවෙන් ලැබිය යුතු වන්දි මුදල ගිල්වා දැමීමට පරිසර කොල්ලකරුවන්ට ඉඩ නොදෙමු!" යන සටන් පාඨය යටතේය.

උද්ඝෝෂණය අවසානයේදී අධිකරණ අමාත්‍යංශය වෙත ලිපියක් ලබාදුන් අතර එහි නිලධාරියෙකු සමග කරන ලද කෙටි සාකච්ඡාවකදී ඉදිරියේදී ඇමතිවරයා සමඟ මේ පිළිබඳ සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දෙන බවට ප්‍රකාශ කර තිබිණි.


මෙම අවස්ථාවේදී පරිසර සංවිධාන වෙනුවෙන් කාංචනා වේවැල්පනා සහෝදරිය, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, එහි ජාත්‍යන්තර ලේකම් අංජන අමරසිංහ සහ ජාතික කමිටු සාමාජික මලින්ද ජීවන් යන සහෝදරවරු අදහස් දැක්වූහ.




# PTA- ATA ත්‍රස්ත පනත්වලට එරෙහිව විරෝධතා

වත්මන් රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව විසින් ගෙන එන නව ATA ත්‍රස්ත පනතට එරෙහිව සමාජවාදී තරුණ සංගමය විසින් රට පුරා විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කළේය. "ඒකාධිපති වියරුවකට සැරසෙන PTA - ATA ත්‍රස්ත පනත් එපා!" යන තේමාව යටතේ මෙය සංවිධානය කරන ලදී.

එහි පළමු විරෝධය අප්‍රේල් මස 04 දින ගම්පහ නගරයේදී පැවැත්විණි. අප්‍රේල් මස 23 වන දින අනුරාධපුර බස් නැවතුම්පොළ අසලදී එහි දෙවැනි උද්ඝෝෂණ පැවැත්විණි. මේ සඳහා සමාජවාදී තරුණ සංගමය හා විවිධ තරුණ කොටස් සහභාගි වූ අතර ඉදිරියේදී රට පුරා ප්‍රධාන නගරවල මෙම පනතට එරෙහිව විරෝධතා ව්‍යාපාර සංවිධානය කරන බව සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා අවධාරණය කළේය.



# SYU Youth Club අත්තනගල්ලෙන් ඇරඹේ

සමාජවාදී තරුණ සංගමය මගින් තරුණ තරුණයින් සංවිධානය කරන ශදමච්ය සකමඉ වැඩසටහන ගම්මට්ටමින් දියත් වෙමින් පවතී. තරුණ තරුණයින් එක්වෙමින් තම ගම්වල සුබසාධන වැඩසටහන්, ශ්‍රම මෙහෙයුම්, ගමේ ප්‍රශ්න කතා කරන මධ්‍යස්ථානය බවට මෙම ශදමච්ය සකමඉ මධ්‍යස්ථානය පත් කරගනිමින් සිටි. මෙය නව ආකාරයකින් යළි ආරම්භ කිරීමට තීරණය කරමින් එහි පළමුවැන්න ගම්පහ අත්තනගල්ලේ අලවල කොට්ඨාසයේදී පසුගිය අප්‍රේල් 09 වැනිදා ආරම්භ විය. මෙය ප්‍රදේශයේ තරුණ තරුණයින්ගේ සහභාගිත්වයෙන් සාර්ථකව පැවැත් විණි.



# රතු ධජ ඉහළටම ලෙළදුනි

ලෝ සතුන් මුදවන
දුකින්
හැම දෙනට ඉන්නට
තොසින්
තැනුමට ඇත ලොවක්...


සත්‍යය රජයන
අසත්‍යය වළලන
සාදුක නිවා ජන
සැම එකට හිනැහෙන
ධෛර්ය දිනුවන්ගේ ලොවක්...

පරපුටුවන්ගේ දැහැන් බිඳ
දවා උන් සුරකිනා විෂ බිම්
අස්වද්දන්නට ඇත ලොවක්
අප සතු මහා ධනය
හිමිකමින්...

මේ මහා මැයි රක්ත ධජ
ඔසවා ඉහළින්ම ලොව
දහදියට කඳුළට වගකියන
සෙවණක් වෙතට ඇදෙමින්
ජයගත යුතුමය හෙට..
දිරිය දුන් තුරුණු අත් ඉහළට
ඔසවා එක මිටට වෙහෙසව
දාහය පරදවා ප්‍රේමයෙන්
පල ලබනු පිණිස අප
නිපැයුම්...



# ජයග්‍රහණය වෙනුවෙන් විශ්වාසයෙන් පෙරට යමු



## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

***නියමුවා:- පළාත් පාලන ඡන්දය නැවත වරක් දිනයක්ද නැතිව කල්දමා තිබෙනවා. ඡන්දය ලබා ගැනීමේ සටන ජ.වි.පෙ. අතහැර ඇති බව සමහරු පවසනවා. මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** දෙවන වතාවටත් පළාත් පාලන මැතිවරණය කල්දැමීමට සිදුවන ලෙස කටයුතු කිරීමෙන් රනිල්-රාජපක්ෂ පාලනයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී බවත්, ඔවුන්ට මේ ඡන්දය ස්ථිර ලෙසම පරාජය ගෙනෙන නිසා ඔවුන් ඊට බියවී ඇති බවත් යළිත් තහවුරු කර තිබෙනවා. පළාත් පාලන ඡන්දය ජ.වි.පෙ.ට පමණක් අයිති ප්‍රශ්නයක් නොවෙයි. ඒක මේ රටේ ව්‍යවස්ථාව, ජනතාවගේ පරමාධිපත්‍යය හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ, පොදු ප්‍රශ්නයක්.

කොහොම වුණත් අපි මේ ඡන්දය ජනතාවට දිනාදීමේ සටන අත හරින්නේ නැහැ. දැනටමත් අපි අධිකරණයේ නඩුකර කිහිපයක් ගොනු කර තිබෙනවා. මේ මැයි මස මුල ඉන් කිහිපයක් විභාගයට ගැනෙනවා. අපි ඒ මගින් අධිකරණ නියෝගයක් ගැනීමට බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම අපි මේ ප්‍රජාතන්ත්‍ර විරෝධී බියගුලු ක්‍රියාදාමයට එරෙහිව එකතු කළ හැකි බලවේග එකතු කරමින් උද්ඝෝෂණ පෙරමුණේත් සටන් කරනවා. දැනටමත් මල්වතු - අස්ගිරි මහානාහිමිවරු, කාදිනල්තුමා, අපේ රටේ සිවිල් සංවිධාන රැසක් ඇතුළු බොහෝ දෙනෙක් මේ ඡන්දය කල් දැමීමට එරෙහිව ප්‍රකාශ නිකුත් කරලා තිබෙනවා. කොහොමත් රනිල්ට මේ ඡන්දය සදාකාලිකව කල්දාන්න බැහැ. ඒ නිසා අපි අනිවාර්යයෙන්ම ඡන්දය දිනාගන්නවා. ඒ විතරක් නොවෙයි ඒ ඡන්දයෙන් රනිල්-රාජපක්ෂ නඩය පරදා අපි ජනතා ජයග්‍රහණයක් ලබා ගන්නවා.

***නියමුවා:- මැතිවරණ මගින් බලය ලබා ගැනීමට පාලකයින් ඉඩ නොදෙන බවත්, ඡන්ද ගැන පමණක් සිතා කටයුතු කිරීමෙන් ජ.වි.පෙ. රැවටීමට ලක්වූ බවත්, ක්‍රියාමාර්ග අහිමි කර තිබෙන බවත් ආදී අදහස් සමාජයේ පවතිනවා. මේ පිළිබඳ ඔබේ අදහස.***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** කිසිම පාලක කල්ලියක් තමන් අත තිබෙන බලය පහසුවෙන් අත් නොහරින බව අපි හොඳටම දන්නවා. ඒක ලොව පිළිගත් පරම සත්‍යයක්. මේ දුෂ්ට පාලකයින් මැතිවරණ මඟින් පමණක් නොවෙයි වෙන කුමන ක්‍රමවලින් හෝ ජනතාවට කැමැත්තෙන් බලය ලබා නොදෙන බව ඉතා පැහැදිලියි. ඒ නිසා අපි රැවටීමට ලක්වී හෝ ක්‍රියාමාර්ග අහෝසි කරගෙන නැහැ.

ජාතික ජන බලවේගය වටා විශාල ජනතා ප්‍රසාදයක් ජන රැල්ලක් නිර්මාණය වුණෙත් මේ ඡන්ද ව්‍යාපාරය තුළම තමයි. ඒ නිසා අපේ ඡන්ද ව්‍යාපාරය අපතේ ගියේ නැහැ. ඡන්දය තියන එකක් නැහැ කියලා අපි මැතිවරණ ව්‍යාපාරය නොකර හිටියා නම් ජනතාව දැනුවත් වෙන්නේ නැහැ. උනන්දු වෙන්නේ නැහැ. ඔවුන් අප වටා එකතු වෙන්නෙත් නැහැ. අපි ජනතාවට බලය ගැනීම සඳහා දේශපාලනය කරනවා. ඡන්ද තිබෙන විට ඡන්දය අපේ දේශපාලනය වනවා වගේම ඡන්දය කල්දමන්නේ නම් එය දිනා ගැනීම හා ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනයට එරෙහිව ජනතා බලවේග පෙළගැස්වීම අපේ දේශපාලනය වෙනවා. අපි දැන් කරන්නේ එයයි. ඒ නිසා අපට ක්‍රියාමාර්ග නැති වන්නේ නැහැ.

***නියමුවා:- හොඳයි. මේ තත්වය මත ඔබ පක්ෂය ඉදිරියේදී ගැනීමට බලාපොරොත්තු වෙන ක්‍රියාමාර්ග මොනවාද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** අපි දේශපාලනය කරන්නේ ඉතාම පැහැදිලි අරමුණක් හා ඉලක්කයක් සහිතව. අපේ අරමුණ තමයි මේ රට බංකොලොත් කළ, වසර 75ක් මේ රට අගාධය කරා රැගෙන ආ මේ ඊනියා ප්‍රභූ දේශපාලන කල්ලිය පැරදවීමත් අපේ රටේ ක්‍රියාත්මක වෙන මෙම බංකොලොත් ආර්ථිකය වෙනස් කර නව නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනගා සැබෑ ආර්ථික සංවර්ධනය අත්පත් කර ගැනීමත්. ඒ කියන්නේ අපි ගැඹුරු සමාජ පරිවර්තනයක් අරමුණු කරගෙන දේශපාලනය කරනවා. ඒ සඳහා වන අපගේ ඉලක්කය වන්නේ මේ පාලක කල්ලිය පරදා ජනතාව වෙත බලය ලබාගැනීමයි. ජනතා පාලනයක් ගොඩනැගීමයි.

ඉතිං ඒක කරන්න නම්, අපි සමාජයේ සාතිශය බහුතරයක් ජනතාවගේ විශ්වාසය දිනාගත යුතු වෙනවා. ජනතාව අපට සහයෝගය දිය යුතු වෙනවා. තනි වචනයෙන් කිවහොත් ඒ සඳහා දැවැන්ත මහජන බලයක්, මහජන ව්‍යාපාරයක් අවශ්‍යයි. ඒ මහජන ව්‍යාපාරය ජාතික ජන බලවේගය ලෙස අපි ගොඩනගා තියෙනවා. එය දැන් පැරණි ධනේශ්වර පක්ෂ පැරදවීමට තරම් විශාල බව, ජනතාව ඒ සමග අත්වැල් බැඳ සිටින බව මෑත කාලයේ සිදුකර තිබූ විවිධ ජනමත සමීක්ෂණවලිනුත් පැහැදිලි වෙනවා.

අප දැන් කටයුතු කරන්නේ ඉතාම සංයමයෙන්, අවබෝධයෙන්. පාලකයින්ගේ ක්‍රියාමාර්ග මගින්ම, පවතින බංකොලොත් සමාජ ක්‍රමය හා දූෂිත පාලන කල්ලිය පිළිබඳව, ඔවුන්ගේ බොරු ප්‍රජාතනත්ත්‍රවාද පිළිබඳව ජනතාවට දැනුම හා අත්දැකීම් ලබාදෙමින් මේ සමාජය වෙනස් කළ හැකි තරමේ දැවැන්ත මහජන බලයක් ගොඩනැගීමයි අපේ කාර්යභාරය. අපේ ක්‍රියාමාර්ග නිර්මාණය වෙන්නේ ඒ අරමුණින්.

තවදුරටත් පුංචි බලපෑම් කණ්ඩායමක භූමිකාව ඉටු කරමින් ඉන්න අපට අයිතියක් නැහැ. අපි බලය ගැනීමට සමත්, ඒ සඳහා හැකියාව ඇති; දැවැන්ත මහජන ව්‍යාපාරයක් බව සිහි තබාගෙන ඊට අනුව උපාය, උපක්‍රම හා ක්‍රියාමාර්ග ගනිමින් කටයුතු කළ යුතුයි. අපි දැන් කරමින් ඉන්නේ ඒක. මෙවර මැයි රැලියෙන් අප පෙන්නුම් කළෙත් ලංකාවේ තිබෙන විශාලතම, සංවිධානාත්මකම, ක්‍රියාශීලීම බලවේගය අප බවයි.

> **අපේ අරමුණ තමයි මේ රට බංකොලොත් කළ, වසර 75ක් මේ රට අගාධය කරා රැගෙන ආ මේ ඊනියා ප්‍රභූ දේශපාලන කල්ලිය පැරදවීමත් අපේ රටේ ක්‍රියාත්මක වෙන මෙම බංකොලොත් ආර්ථිකය වෙනස් කර නව නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනගා සැබෑ ආර්ථික සංවර්ධනය අත්පත් කර ගැනීමත්. ඒ කියන්නේ අපි ගැඹුරු සමාජ පරිවර්තනයක් අරමුණු කරගෙන දේශපාලනය කරනවා. ඒ සඳහා වන අපගේ ඉලක්කය වන්නේ මේ පාලක කල්ලිය පරදා ජනතාව වෙත බලය ලබාගැනීමයි.**

***නියමුවා:- ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ පාලනය මේ වන විට සමාජය වෙත මර්දනකාරීත්වයක් මුදාහරිමින් ඉන්නවා. සාමකාමී මහජන උද්ඝෝෂණවලට පහර දෙනවා. වෘත්තීය සටන් මර්දනය කිරීමට උත්සාහ කරනවා. ප්‍රතිත්‍රස්ත පනත වගේ භයානක පනත් ගේනවා. මේ තත්වයට ඔබ සංවිධානය මුහුණ දෙන්නේ කොහොමද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** සාමකාමී උද්ඝෝෂණවලට පවා පහර දීමෙන්, ඡන්ද කල්දැමීමෙන්, ත්‍රස්තවාදී පනත් ගෙන ඒමෙන්, රනිල් පෙන්වන්නේ කුමක්ද? ඒ ඔවුන් දැන් දුර්වල බවත්, මහජන බලයට බියවී සිටින බවත් නෙමෙයිද? රනිල් කියන්නේ ජනවරමක් නැති පාලකයෙක්. ආණ්ඩුවටත් ජනවරමක්, ජන සහායක් නැහැ. ආණ්ඩුවේ පක්ෂ බෙදී විසිරී දුර්වලව පවතිනවා. රාජපක්ෂවරු පවා දැන් ජනතා අප්‍රසාදයට පවා පත්වූ පිරිසක්. ඉතිං ඔවුන්ට ජනතා සහාය සහිතව බලයේ ඉන්නත් බැහැ. ජනවරමකින් යළි බලයට එන්නත් බැහැ. ඒ අනුව ඔවුන් ඉන්නේ අපේක්ෂාභංගත්වයට පත්වෙලා. බියට කලබලයට පත්වෙලා. ජනතාවගේ විවේචනයක්, විරෝධයක් පවා දරාගැනීමට නොහැකිව තිබෙන්නේ ඒකයි. තම පාලනයට එරෙහිව, තම පාලනයේ ජන පීඩන ක්‍රියාමාර්ගවලට එරෙහිව එකතු වෙන ජනතා විරෝධය මර්දනය කරමින් තවත් ටික කාලයක් බලයේ සිටීමට ඔවුන් කල්පනා කරනවා. ඒත් ලොව පුරාම ඇති අත්දැකීම වන්නේ එවැනි ඒකාධිපති පාලකයන් හා ඒකාධිපති පාලනයන් මහජන බලය ඉදිරියේ පරාජය වී ඇති බවයි.

ඒ නිසා රනිල් වික්‍රමසිංහලා, ඔවුන්ගේ කුඩා කල්ලි කලබල වුණාට අපි කලබල වෙන්නේ නැහැ. අපි ඔවුනට බිය වන්නේත් නැහැ. අපි ප්‍රකෝප වන්නේත් නැහැ. රනිල් වික්‍රමසිංහලා කැමති සටන් බිමක් දැන් තියෙනවා. ඒ ජනතාවට ප්‍රකෝපකාරී ප්‍රචණ්ඩ මාවතට ගැනීම. ඒක රනිල්ට වාසියි. ජනතාවට අවාසියි. ජනතාවට වාසි ප්‍රජාතන්ත්‍රවාදයේ මාවත. සාමකාමී අරගලයේ මාවත. අපි මතුවන සියලු තත්වයන් උපයෝගී කරගෙන එම මාවතේ ජනතාව මෙහෙයවීමට කටයුතු කරනවා.

***නියමුවා:- කොළඹ විශාල මැයි රැලියක්, පෙළපාළියක් පවත්වලා ලංකාවේ විශාලතම ජනතා සහභාගිත්වය සහිත මැයි දිනයක් කිරීමට ඔබේ පක්ෂය සමත් වුණා. මෙතනින් ඉදිරියට ඔබේ දේශපාලන ගමන්මග කොහොමද?***


***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඔව්. අපේ රට වසර 75ක් තිස්සේ පාලනය කළ, කලක් ප්‍රධාන යැයි කියාගත් දේශපාලන පක්ෂවලට ජන සහභාගිත්වය සහිත මැයි රැලියක්වත් පවත්වා ගැනීමට නොහැකිවීමත් විශාලතම මැයි රැලියක් කිරීමට අප සමත්වීමත් විසින් යළිත් පෙන්නුම් කරන්නේ කුමක්ද? ඒ අන් කිසිවක් නොවෙයි පැරණි ධනේශ්වර, ප්‍රභූ දේශපාලනය ජනතාව ප්‍රතික්ෂේප කරන බවත්, නව මාවතක යාමට ජනතාව තුළ ඇති අධිෂ්ඨානයත් තමයි.

ජාතික ජන බලවේගය සමග නිර්මාණය වී ඇති මේ දැවැන්ත ජනතා බලය, ජනතා විශ්වාසය ජයග්‍රහණය දක්වා රැගෙන යාම තමයි අපේ ඉදිරි වගකීම. පාලක කල්ලියේ විවිධ බාධා, මර්දනයත් අභිබවමින්, විවිධ සතුරු බලවේග විසින් අපට එරෙහිව නිර්මාණය කෙරෙන මඩ අවලාද විකෘති කිරීම්වලට මුහුණ දෙමින්, ජනතා විශ්වාසය රකිමින් ඉදිරියට යාමේ වගකීම අපි ඉදිරිපිට තිබෙනවා. අප පළාත් පාලන ඡන්දය දිනාගත යුතුයි. ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් රැකගත යුතුයි. ත්‍රස්ත විරෝධී පනත් පරදා මූලික මිනිස් අයිතීන් රැකගත යුතුයි. විවිධ ජන කණ්ඩායම්වල අයිතීන් වෙනුවෙන් අරගල කරමින්, සියලු බලවේග එක අරමුණකට, එනම් සමාජය ගැඹුරු පරිවර්තනයකට ලක්කිරීම සඳහා මහජන බලයක් ගොඩනැගීමේ අරමුණට මෙහෙයවමින් පෙරට යා යුතුයි. එම කාර්යයන් ධෛර්යයෙන් හා වැරදිවලට ඉඩ නොතබා ක්‍රියාවට නැගීම තමයි අපේ ඉදිරි දේශපාලන ගමන වෙන්නේ. අපි අපේ ජනතාවට කියනවා ජයග්‍රහණය වෙනුවෙන් විශ්වාසයෙන් පෙරට යමු කියලා.

අවසාන වශයෙන් 2023 වසර ජනතා ජයග්‍රහණයේ වසර බවට පත් කිරීමට පෙරට එන ලෙස අප සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා.

# නව බල තුලනය තුළ අභියෝගයට ලක්වන එක්සත් ජනපද ආධිපත්‍යය

ලෝක දේශපාලන බල තුලනයේ තීරණාත්මක වෙනසකට තුඩුදිය හැකි වෙනස්කම් ගණනාවක්ම පසුගිය මාස කිහිපය තුළදී සිදු වී තිබේ. සෞදි අරාබිය මැද පෙරදිග කලාපයේ ප්‍රධාන එක්සත් ජනපද විරෝධී රටවල් දෙකක් වන ඉරානය සහ සිරියාව සමග රාජතාන්ත්‍රික සබඳතා යළි ගොඩනගා ගැනීම ඉන් එකකි.



චීනයේ මැදිහත් වීමෙන් පසුගිය මාර්තු දහ වන දින ඉරානය හා සෞදි අරාබියාව සුවිශේෂී ගිවිසුමකට අත්සන් තබන ලදී. අවුරුදු 07 කට ආසන්න කාලයක් පුරා නැවතී තිබූ ඉරාන හා සෞදි අරාබි රාජතාන්ත්‍රික සබඳතා මාස දෙකක කාලයක් තුළ නැවත ආරම්භ කිරීමටත් තානාපති කාර්යාලය නැවත විවෘත කිරීමටත් එහිදී එකඟතාවයට පැමිණ තිබේ. මෙම පියවර මැදපෙරදිග කලාපය තුළ දේශපාලන ස්ථාවරභාවය රැක දීමටත් කලාපය තුළ දේශපාලන උණුසුම අඩු කර සාමය ඇති කිරීමටත් හේතු වනු ඇතැයි මධ්‍යස්ථ විචාරකයන්ගේ මතයයි. මෙම කාර්යයට මැදිහත් වීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් අන්තෝනියෝ ගුටෙරස් චීනය, ඕමානය හා ඉරානයට විශේෂ ස්තුතියක් ප්‍රකාශ කර තිබුණි. මීට අමතරව කලාපයේ අනෙකුත් රටවල් වන එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර්, ලෙබනනය හා බහරේනයද මේ සම්බන්ධයෙන් සිය ප්‍රසාදය පළ කර තිබේ.

මේ අතර සවුදි අරාබිය පසුගිය මාර්තු විසි වන දින චීනය හා රුසියාව මුල්වී පවත්වාගෙන යන ෂැන්හයි සහයෝගිතා සංවිධානයට එක් වීමට තීරණය කළේය. එරට රජු වූ සල්මන් බින් අබ්දුල්ලාසිස් අල් සවුදි (Salman Bin Abdulaziz al Saudi) ගේ මූලිකත්වයෙන් රැස්වුණු කැබිනට් මණ්ඩලය විසින් එම තීරණය ගෙන තිබේ. ඒ අනුව ෂැන්හයි සහයෝගීතා සංවිධානයට එක්වන තුන්වන අරාබියානු රට සෞදි අරාබිය වනු ඇත. මීට පෙර ඊජිප්තුව හා කටාර් රාජ්‍යය එකී සංවිධානයේ හවුල්කරුවන් බවට පත්වී තිබුණි.

චීනයේ හා රුසියාවේ මූලිකත්වයෙන් ෂැන්හයි සහයෝගිතා සංවිධානය ගොඩනඟනු ලබන්නේ 2009 වසරේදී කසකස්තානය, කිර්ගිස්තානය, තජිකිස්ථානය හා උස්බෙකිස්තානය සම්බන්ධ කරගනිමිනි. පසුව ඉන්දියාව හා පකිස්ථානයද එකී සංවිධානයේ සාමාජිකත්වය ලැබීය. මේ වසර අවසාන වනවිට ඉරානයද මෙම සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටී.

මීට අමතරව සෞදි අරාබියාව ඉදිරියේදී රැස්වීමට නියමිත BRICS සංවිධානයේදී සාමාජිකත්වය ලබා ගැනීමට කැමැත්ත පළ කර තිබේ.

මැදපෙරදිග කලාපය තුළ ඇමරිකානු වුවමනාවන් වෙනුවෙන් මැදිහත් වූ ප්‍රධාන රටවල් දෙක වූයේ ඊශ්‍රායලය හා සෞදි අරාබියයි. නමුත් සෞදි අරාබිය මේ මොහොතේ දී ජාත්‍යන්තර වශයෙන් ඇමරිකන් විරෝධී කඳවුර සමග පෙළඟ ැසෙමින් සිටින ආකාරය මෙම සිදුවීම්වලින් පැහැදිලි වෙමින් තිබේ.

**BRICS සංවිධානයේ ඉදිරි ක්‍රියාමාර්ග**

මේ වසරේ අගෝස්තු මාසයේ දී දකුණු අප්‍රිකාවේ ඩර්බන්හිදී පැවැත්වීමට නියමිත බ්‍රික්ස් සංවිධානයේ මීළඟ සමුළුවේදී එක්සත් ජනපද ඩොලරයේ ආධිපත්‍යයට එරෙහිව නව මුදල් ඒකකයක් හඳුන්වා දීමට එම සංවිධානය සූදානම් වෙයි. එහි පළමු පියවර ලෙසින් සංවිධානය අයත් රටවල් අතර ද්වීපාර්ශික ගනුදෙනු එක් එක් රටවල මුදල් ඒකක මගින් සිදුකිරීමටත් දෙවන පියවර ලෙස නව ඩිජිටල් මුදල් ඒකකයක් හෝ නව මුදල් ඒකකයක් හඳුන්වා දීමටත් බලාපොරොත්තු වෙයි. ඉදිරියේදී හඳුන්වාදීමට බලාපොරොත්තු වන නව මුදල් ඒකකය ඩොලරය හෝ යුරෝව ශක්තිමත් කරනවා වෙනුවට එසේත් නැත්නම් ඩොලරය හෝ යුරෝව එකී මුදල් ඒකකයට ඈඳනවා වෙනුවට එය වටිනා ලෝහවලට ඈඳීමට බලාපොරොත්තු වේ. පසුගිය මාර්තු 29වැනි දින ලෝකයේ දෙවන විශාලතම ආර්ථිකය හොබවන චීනය හා ලතින් ඇමරිකාවේ විශාලතම ආර්ථිකය වන බ්‍රසීලය දෙරට අතර වෙළෙඳ ගනුදෙනු චීන යුවාන් හා බ්‍රසීලය රියාල්වලින් සිදු කිරීමට තීරණය කරන ලදී. චීන මුදල් ඒකකය වන යුවාන් මේ වන විටත් බ්‍රසීලයේ තෙවන විශාලතම ජාත්‍යන්තර සංචිත මුදල ලෙසද යොදා ගැනේ.

BRICS සංවිධානයට අයත් වන බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය හා දකුණු අප්‍රිකාව යන රටවල ජනගහනය ලෝක ජනගහනයෙන් සියයට හතළිහක් පමණ වන අතර මෙම රටවල ආර්ථිකය ලෝක දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 25ක් පමණ වේ.

මීට අමතරව බ්‍රික්ස් සංවිධානය ඉදිරියේ දී බ්‍රික්ස් plus ලෙස පුළුල් කිරීමටද මූලික කටයුතු සූදානම් කෙරෙමින් තිබේ. ඒ අනුව ඉදිරියේ දී ඉරානය, සෞදි අරාබිය, ඊජිප්තුව, ඇල්ජීරියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, මෙක්සිකෝව, ආජන්ටිනාව, නයිජීරියාව ආදී රටවල්ද එකී සංවිධානයේ සාමාජිකත්වය ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර තිබේ.

**එක්සත් ජනපද ආධිපත්‍යය අභියෝගයට**

මේ අතර 2018 වසරේදී ඉරානයට එරෙහිව එක්සත් ජනපද සම්බාධක පැනවීමෙන් පසු සහ යුක්රේන යුද්ධය ආරම්භ වීමෙන් පසු රුසියාවට එරෙහිව එක්සත් ජනපදය සම්බාධක පැනවීමෙන් පසු ඉරානය හා රුසියාව අතර බැංකු කටයුතු සඳහා නව පණිවිඩ හුවමාරු ක්‍රමයක් (SEPAM/SPFS) හඳුන්වා දීමට දෙරට කටයුතු කළේය. මෙම පණිවුඩය පද්ධතිය 2023 ජනවාරි සිට ක්‍රියාත්මක වේ. දෙරට අතර වෙළෙඳ ගනුදෙනුවලින් සියයට හැටක් පමණ මේ වන විට සිදු කෙරෙන්නේ රූබල් හා රියාල් සම්බන්ධ කර ගනිමිනි.

චීනය හා රුසියාව අතරද බැංකු කටයුතු සඳහා විකල්ප ක්‍රමවේදයක් ගොඩනැඟීමට සූදානම් වුවද එසේ කළහොත් චීනය, එක්සත් ජනපද ඩොලර් ගනුදෙනු සඳහා ඇති SWIFT පද්ධතියෙන් ඉවත් කරනු ලබන බවට එක්සත් ජනපදය විසින් අනතුරු අඟවා තිබේ. කෙසේ වෙතත් චීනය හා රුසියාව යන දෙරට අතර වෙළෙඳ ගනුදෙනු දැනටත් දෙරටේ මුදල් ඒකක භාවිතා කරමින් සිදු කිරීම ආරම්භ කර ඇත. මේ වන විට ලෝකයේ විදේශ විනිමය හුවමාරුවලින් සියයට හතක් චීනයේ යුවාන් මුදල් ඒකකය මගින් සිදුවන අතර ලෝකයේ පස්වන විශාලතම සංචිත මුදල ලෙසත් වෙළඳ ගනුදෙනු පියවන තුන්වන විශාලතම මුදල් ඒකකය ලෙසත් දැනටමත් යුවාන් මුදල් කටයුතු කරමින් සිටී.

පසුගියදා ප්‍රංශ ජනාධිපති මැක්‍රෝන් චීනයේ සංචාරය අතරතුරදී ප්‍රකාශ කර සිටියේ යුරෝපය, එක්සත් ජනපදය මත ඇති යැපීම අඩු කළ යුතු බවයි. යුරෝපය තමන්ගේ නොවන අර්බුදයයන්ට ගොදුරු නොවීමටත් 'උපක්‍රමික ස්වාධීනත්වය' පවත්වාගෙන යාමටත් කෙරෙන බාධා වැළැක්වීමට සමත් විය යුතු බව පැවසූ ඔහු, චීනය හා එක්සත් ජනපදය අතර තායිවානය සම්බන්ධයෙන් ඇති වී තිබෙන අර්බුදයට තමන් ගොදුරු නොවීමට කටයුතු කළ යුතු බවත් පවසා තිබේ. මැක්‍රෝන්ගේ මෙම ප්‍රකාශය මේ වන විට වර්ධනය වෙමින් පවතින එක්සත් ජනපදය හා යුරෝපය අතර ප්‍රතිවිරෝධය ප්‍රකාශයට පත් කරන්නකි.

මේ වන විට එක්සත් ජනපදයේ ආර්ථික ආධිපත්‍යය සඳහා සේවය කරමින් සිටින ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි සංවිධානද හුදෙකලා කරමින් ඊට ප්‍රතිවිරුද්ධව නව බැංකු පද්ධතියක්ද බිහිවෙන සලකුණු ප්‍රකාශයට පත්වී තිබේ. ඉන් එක් බැංකුවක් වන්නේ බ්‍රික්ස් බැංකුවයි. අනෙක ආසියානු යටිතල සංවර්ධන සහ ආයෝජන බැංකුවයි.

මෙම සියලු සිදුවීම්වලින් ප්‍රකාශයට පත් කරමින් තිබෙන්නේ ලෝක බල තුලනයේ වෙනස්වීමකට ඇති සූදානමයි. මෙතෙක් ලෝකය තුළ සිය තනි ආධිපත්‍යය පතුරුවමින් ක්‍රියාත්මක වූ එක්සත් ජනපදයේ එකී ආධිපත්‍යය අභියෝගයට ලක් වෙමින් තිබෙන බවයි.

## කියුබාව: කානෙල්ට දෙවැනි ධුර කාලයක්



පසුගිය අප්‍රේල් 19වැනි දින කියුබානු ජනාධිපති මිගෙල් ඩයස් කානල් සිය දෙවන ධුර කාලය සඳහා එරට පාර්ලිමේන්තුව විසින් තෝරා පත් කර ගන්නා ලදී. මිගෙල් ඩයස් කානල් කියුබානු ජනාධිපතිවරයා ලෙස පළමුවරට තෝරා පත් කර ගනු ලැබුවේ හිටපු ජනාධිපති රවුල් කස්ත්‍රෝගේ ඇවැමෙනි. ඔහු මේ වන විට කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාද වේ.

## ප්‍රංශය: විශ්‍රාම කප්පාදුවට එරෙහිව නොනවතින විරෝධතා




ප්‍රංශ ජනාධිපති මැක්‍රෝන්ගේ විශ්‍රාමික ප්‍රතිසංස්කරණයන් නීතියක් බවට පත්වීමත් සමග ප්‍රංශය පුරා යළිත් වරක් ඊට එරෙහි විරෝධතා රැල්ලක් පැන නැගුණි. මෙවර විරෝධතා පැන නැගුණේ අප්‍රේල් 14වැනිදා සිටය. ප්‍රංශ වෘත්තිය සමිති සම්බන්ධීකරණය කරන පොදු කම්කරු සම්මේලනය මෙම විශ්‍රාමික ප්‍රතිසංස්කරණ ආපසු හරවන තුරුම විරෝධතාවයේ යෙදීමට තීරණය කර ඇත.

## චිලිය: ලිතියම් කර්මාන්තය ජනසතු වෙයි



චිලියේ ජනාධිපති ගේබ්‍රියෙල් බෝරික් එරට ලිතියම් කර්මාන්තය ජනසතු කිරීමට තීරණය කර තිබේ. එරට ආර්ථික සංවර්ධනයත් පාරිසරික සුරක්ෂිතතාවත් අරමුණු කර ගනිමින් එම තීරණය ගෙන තිබේ. ලෝකයේ විශාලතම ලිතියම් නිධි ඇත්තේ චිලියේය. චිලිය ලෝකයේ දෙවන විශාලතම ලිතියම් නිෂ්පාදකයාද වේ.

## එක්සත් ජනපදය: සරසවි සේවකයෝ විරෝධතාවේ




එක්සත් ජනපදයේ නිව් ජර්සිහි Rutgers විශ්වවිද්‍යාලයේ සේවකයෝ අප්‍රේල් 01 දින ඉල්ලීම් කිහිපයක් මුල් කරගනිමින් විරෝධතාවක යෙදුණහ. එකී විරෝධතාවන්ට විශ්වවිද්‍යාල සේවකයින් නමදහසක් පමණ සහභාගි වූ අතර ප්‍රධාන වෘත්තීය සමිති තුනක් එයට නායකත්වය දී තිබුණි. ඔවුන්ගේ ඉල්ලීම් වූයේ වැටුප් වැඩිකිරීම, රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම හා සෞඛ්‍ය රක්ෂණ සහන ලබා ගැනීමය.

# රනිල්ගේ IMF සිහිනය සහ මහ පොළොවේ යථාර්ථය

රනිල් වික්‍රමසිංහ වෙනුවට ජනාධිපති අයි.එම්.එෆ්. මූල්‍ය අරමුදලෙන් ලබා ගන්නා ඩොලර් බිලියන 2.9ක ණය මුදලෙන් අවුරුදු 75ක් පුරා ජනතාව පත්කළ ආර්ථිකය ගොඩනගන දෙස ජනතාවට නැරඹීමට දැන් කටයුතු සලසා දී ඇත. රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුව අමතා ප්‍රකාශ කළේද ඒ සඳහා සියලු දෙනා සහාය දෙන ලෙසයි. සහාය නොදෙන දේශපාලන පක්ෂ, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීන් පමණක් නොව කොටස් වෙළඳපොළ වුවද වසා දැමීමට වුවද ඔහු සූදානම්ය. ඒ නිසා ප්‍රජාතන්ත්‍ර විරෝධී ත්‍රස්ත විරෝධී පනතටද ජනතාව කට පියාගෙන සිටිය යුතුය. පාර්ලිමේන්තුව සහාය දිය යුතුය. ඒ රනිල් රට ගොඩගන්න හදන වැඩේට සහාය වීම පිණිසය; ඒ සඳහා බාධා නොකර සිටීමටය.


### ආර්ථික කප්රුක අයි.එම්.එෆ්.ද?

ආණ්ඩු හිතවාදී රනිල්ගේ පිරිස් මෙන්ම මීට මාස කිහිපයකට ඉහතදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යාම රට පාවාදීමක් ලෙස හැඳින්වූ රාජපක්ෂ කල්ලියේ පිරිසක්ද අද මූල්‍ය අරමුදලේ ණය සලකන්නේ සිතූ පැතූ දේ ලබාදෙන සුරබිදෙන ලෙසටය. කප්රුක ලංකාවට පහළ කළා සේය. ඔවුනට අනුව සමාජය තුළ තහවුරු කිරීමට ඔවුන් උත්සාහ කරන මත කිහිපයක් වේ. මෙම බිලියන 2.9ක ණය ලැබීමත් සමග මාස කිහිපයකින් රටේ සියලු ප්‍රශ්න විසඳී සෞභාග්‍යය උදාවෙන බවය; මෙය ණයක් නොව නොමිලේ ලැබෙන ප්‍රදානයක් බවය. ඉන් ප්‍රධාන අදහස්ය. ණය සමග යෝජිත දූෂණ මර්දන පනත ලංකා ඉතිහාසයේ ගෙනෙන ප්‍රබලම දූෂණ මර්දන අවිය නිසා මේ සමග සියලුම හොරුන්ට දඬුවම් ලැබෙන බව තවත් එකකි. මේ මඟින් ගොඩනැඟෙන ආර්ථිකයට රට තුළින් ආයෝජන ගලා එන බව තවත් අදහසකි. අයි.එම්.එෆ්. වැඩසටහන සමග මේ පවතින ආණ්ඩුව හා රනිල් බැඳී ඇති බැවින් ඡන්දයක් මඟින් බලය අඩුවීමක් හෝ ආණ්ඩු මාරුවීමක් සිදුවුව හොත් ණය ලැබී යා නොහැකි බව තවත් කරුණකි. එමගින් පළමුව ආර්ථිකය ගොඩනගා පසුව ප්‍රජාතන්ත්‍රවාදය ඇති කර, ඡන්ද පැවැත්විය හැකිය යන්න තවත් අදහසකි. (ඒ නිසා) ඡන්ද ගැන කතා නොකර ප්‍රජාතන්ත්‍රවාදය නොඉල්ලා මේ අයි.එම්.එෆ්. ණය මල් වට්ටියට හැමෝම අත ගැසිය යුතු බවද අපට පැවසේ.

එහෙත් ඒ අතර ජනතාව විසින් ක්‍රමයෙන් පංගුව වැඩි කරන බදු බර ඉවසා දරා ගත යුතුය. උපයන විට අයකරන බදු රුපියල් ලක්ෂයේ සීමාවේ සිට 36% දක්වා වැඩි කිරීම, වැට් බදු ඉහළ දැමීම, විදුලි බිල වැඩිකිරීම, පොලී අනුපාත ඉහළ දැමීම, අමුද්‍රව්‍ය ආනයන සීමා කිරීම, ඉදිකිරීම ඇතුළු කර්මාන්ත බිඳ වැටීමට සැලසීම, ඩොලර් බිලියන 11කින් පමණ ආර්ථිකය හැකිළීම, උද්ධමනය ඉහළ දැමීම ආදී සියල්ල ඉදිරි වැඩ තකා අයි.එම්.එෆ්. ණය පහසුකම ලබා ගැනීම වෙනුවෙන් දැනටමත් කර ඇති කැපකිරීම්ය.

### ණය වෙනුවෙන් 'කළ යුතු යුතුකම්'

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිනට දහමට ලැදි ආයතනයක් ලෙස අප රටට මෙම ණය මුදල ලබා නොදෙයි. මෙම වැඩසටහනේ අභිමථාර්ථ ලෙස නම් කර ඇති




කොටසේම ඒ සඳහා වන මූලික අභිමථාර්ථ 06ක් ලෙස සඳහන් ඒ කරුණු යෝජනා කර ඇත.

1. ආදායම ඉහළ දැමීම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය, ඒ සඳහා මූල්‍ය හා රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීම. (පිටුව 11)
2. රාජ්‍ය ණය තිරසරභාවය තහවුරු කිරීම (පිටුව 16)
3. මිල ස්ථාවරත්වය තහවුරු කිරීම සහ සංචිත ගොඩනැගීම (පිටුව 17)
4. මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම (පිටුව 21)
5. දූෂණ අවදානම අඩු කිරීම (පිටුව 23)
6. ආර්ථික වර්ධනය ඇති කිරීම (පිටුව 24)

> මූල්‍ය අරමුදලේ ණය වන 2.9ක ප්‍රමාණයද ඇතුළුව වසර 04ක් තුළම අලුතින් අප රටක් ලෙස තව ණය ඩොලර් බිලියන 20.09ක් ලබාගත යුතු අතර, එම කාලය තුළ අප ගෙවිය යුතු ප්‍රමාණය ඩොලර් බිලියන 27.9කි. (2023 සිට 2028 දක්වා ණය හා වාරික පොලී ගෙවීමට) මෙම කාලය තුළ ලබා ගැනීමට අපේක්ෂිත ණය සහනය මුළුමනින්ම ලැබෙන්නේ යැයි උපකල්පනය කළද, (ඩොලර් බිලියන 14) එය ලැබුණු පසුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සියලු කොන්දේසිවලට යටත්ව අප තවත් ඩොලර් බිලියන 07ක් ණයකාර රටක් බවට පත්වනු ඇත. මූල්‍ය අරමුදලේ ණය සහනයක් නොව උගුලක් බව අප පවසන්නේ එබැවිනි.

මෙම අභිමථාර්ථ ඉටුකර ගැනීම වෙනුවෙන් ආණ්ඩුව විසින් වසර හතරක් තුළ ඉටු කළ යුතු කාර්යයන් ලෙස මූල්‍ය අරමුදල විසින් ලබා දී ඇති කරුණු 45ක ලැයිස්තුවක් සඳහා ආණ්ඩුව එකඟ වී ඇත. ඉන් 15ක් පූර්ව කොන්දේසි වන අතර, ඉතිරි 30 වැඩසටහන අතරතුර ඉටුකළ යුතුය. පසුගිය දා රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුවේදී සඳහන් කළේ එම කරුණුය.

### අභියෝග

මෙම ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි අභියෝග පිළිබඳව මූල්‍ය අරමුදල තම වාර්තාව ආරම්භයේම සඳහන් කර ඇත. බාහිර අභියෝග ලෙස (External Risks) කලාපයේ ඇති විය හැකි අර්බුදය, සැපයුම් ජාල බාධා, භාණ්ඩ මිල ඉහළ යාම, ගෝලීය ආර්ථික අර්බුද, මූල්‍ය වෙළඳපොළ කඩා වැටීම තර්ජන ලෙස සඳහන් කර ඇත.

දේශීය (අභ්‍යන්තර) අභියෝග (Internal Risks) ලෙස යෝජනා ක්‍රියාත්මක කිරීමේදී ජනතාවගෙන් එල්ල විය හැකි අසහනකාරී විරෝධයන්, රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකරණය මගින් ඇති විය හැකි දූෂණ චෝදනා, ප්‍රතිසංස්කරණය කෙරෙහි ලංකාවේ ඇති පසුගාමී බව ආර්ථිකය හැකිළීමට ගන්නා ක්‍රියාමාර්ග හමුවේ අඛණ්ඩව ඉහළ යා හැකි උද්ධමනයේ බලපෑම, ණය ප්‍රතිව්‍යුහගත කිරීමට යාම හේතුවෙන් බැංකු මත ඇති විය හැකි පීඩනය හමුවේ පැනනගින ද්‍රවශීලතා ප්‍රශ්න සහ බැංකු සතු වත්කම් පිරිහීම ආදිය දක්වා ඇත.

වසර හතරක් තුළ, කොටස් වාරික ලෙස ඩොලර් බිලියන 2.9ක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලබා දෙනවිට එම කාලය තුළ ආණ්ඩුව විසින් ඉටුකළ යුතු ඉතාම දුෂ්කර හා ප්‍රායෝගික නොවන යෝජනා විශාල ප්‍රමාණයක් අඩංගු කර ඇත.

01. දැනට ලබාගෙන ඇති විදේශ ණයවලින් (ඩොලර් බිලියන 41න්) 14ක් ණය සහන ලෙස (Debt Relief) කපා හැරීමට හෝ ගෙවීම් කල්දමා ගැනීමට ණය හිමියන් එකඟ කර ගැනීම. එය සමස්ත විදේශ ණයවලින් 1/3කි.

02. වසර 4ක් තුළ කොටස් වශයෙන් බහු පාර්ශ්වීය හෝ ද්විපාර්ශ්වීය ලෙස ඩොලර් බිලියන 10.28ක අලුත් ණයක් ලබා ගැනීම

03. වසර 04ක් තුළ ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) ඩොලර් බිලියන 02ක ණයක් සහ ලෝක බැංකුවෙන් ඩොලර් බිලියන 1.75ක ණය මුදලක් ලබාගැනීම

04. 2027දී, ඩොලර් බිලියන 1.5ක් සහ 2028දී තවත් ඩොලර් බිලියන 1.57 ක් ලෙස නව ස්වෛරී බැඳුම්කර ණය දෙකක් ගැනීම

මේ අනුව මෙම මූල්‍ය අරමුදලේ ණය වන 2.9ක ප්‍රමාණයද ඇතුළුව වසර 04ක් තුළම අලුතින් අප රටක් ලෙස තව ණය ඩොලර් බිලියන 20.09ක් ලබාගත යුතු අතර, එම කාලය තුළ අප ගෙවිය යුතු ප්‍රමාණය ඩොලර් බිලියන 27.9කි. (2023 සිට 2028 දක්වා ණය හා වාරික පොලී ගෙවීමට) මෙම කාලය තුළ ලබා ගැනීමට අපේක්ෂිත ණය සහනය මුළුමනින්ම ලැබෙන්නේ යැයි උපකල්පනය කළද, (ඩොලර් බිලියන 14) එය ලැබුණු පසුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සියලු කොන්දේසිවලට යටත්ව අප තවත් ඩොලර් බිලියන 07ක් ණයකාර රටක් බවට පත්වනු ඇත. මූල්‍ය අරමුදලේ ණය සහනයක් නොව උගුලක් බව අප පවසන්නේ එබැවිනි.

### ණය අසහනය

ණය සහනයක් නොව අසහනයක්, අර්බුදයක් බව පෙනී යන්නේ 2023 සිට 2028 දක්වා ආණ්ඩුව ඉටු කළ යුතු කොන්දේසි සලකා බලන විටදීය. මීට වඩා ආර්ථික අර්බුද කාල වකවානුද සහිතව මීට පෙර 16 වතාවක් ලංකාවේ ආණ්ඩු මූල්‍ය අරමුදලේ ණය ලබා ගැනීමට ගොස් ඇති අතර එම කොන්දේසි සම්පූර්ණ කර ණය ලබා ගෙන ඇත්තේ 09 වතාවකදි පමණි. මෙවර ගිවිසුම් ගත විස්තීර්ණ ණය පහසුකම (EFF) සඳහා පෙර අවස්ථා තුනකදී එළඹී ඇති අතර එම අවස්ථා තුනම අතරමඟ නතර කර ඇත. මේ ඉහත කිසිදු අවස්ථාවකදී ලංකාව බූන්වත් රජයක් ලෙස ප්‍රකාශයට පත් නොවූ අතර, මේ වන විට බූන්වත් රාජ්‍යයක් ලෙස ශ්‍රේණිගත වී ඇති නිසා මෙවර ගිවිසුම කඩවී ආපසු හැරීමට සිදුවුවහොත් එහි ප්‍රතිවිපාකද බරපතළ විය හැකිය. එසේම ණය කොන්දේසි සහ ඉලක්ක සපුරා ගැනීමද පහසු කාර්යයක් වී නොමැත.

### ණය ප්‍රතිව්‍යුහගත කිරීම

මෙවර ඉදිරිපත් කර ඇති ව්‍යුහාත්මක කොන්දේසිවලට අමතරව මූල්‍ය පද්ධතියේ ආණ්ඩුව මුහුණ දෙන අසීරුම ඉලක්කයක් වී ඇත්තේ, දේශීය සහ විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමයි.

ආණ්ඩුවේ මුළු ණය බර ඩොලර් මිලියන 83,595 (රුඃ බිලියන 30,355) ක් වන අතර, එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 128%කි. එයින් විදේශීය ණය ඩොලර් මිලියන 41,495කි. දේශීය ලෙස ලබා ගෙන ඇති ඩොලර් ණය මිලියන 42,121කි.

විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ඉන්දියාව, ජපානය, චීනය හා පැරිස් ක්ලබ් ණය හිමියන් සමග එකඟතාවයකට පත් විය යුතුය.

ආණ්ඩුව පවසන පරිදි, දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ආණ්ඩුව ආරක්ෂා කරන්නේ භාණ්ඩාගාර බිල්පත්වලින් මහ බැංකුව මගින් ලබාගෙන ඇති රුපියල් බිලියන 4126ක් සහ භාණ්ඩාගාර බැඳුම්කරවලින් ලබාගෙන ඇති රුපියල් මිලියන 8722ක් කපා හැරීමටයි. බැලූ බැල්මට සෘජු ආර්ථික හානි නැතැයි පෙනී ගියද, මෙම තීරණ රාජ්‍ය බැංකු පද්ධතිය කෙරෙහි අතිශය වේදනාකාරී බලපෑමක් ඇති කිරීම වැළැක්විය නොහැකිය.

### නැසී නොනැසී ණය විඳීම

ආණ්ඩුවට 2028 දක්වා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආ කවරණය ලබා ගැනීමට නම් දෙවන වාරිකය සම්පූර්ණ කිරීමට පෙර 2023 වසරේ ඉලක්ක සම්පූර්ණ කරගත යුතුය. 2023දී දළ මූල්‍ය අවශ්‍යතාව ලෙස ඩොලර් බිලියන 6.6ක් (මිලියන 6,636ක්) සම්පූර්ණ කරගත යුතුය. එයින් ඩොලර් බිලියන 2,109 ක් ද්විපාර්ශවීය හා

11 වැනි පිටුවට



"මිනිසා මාලිගාවකදී හා පැල්පතකදී වෙනස් ආකාරයෙන් සිතයි. සාගින්න නිසා, දුක්ඛිත තත්වය නිසා ඔබට ඔබේ සිරුරතුල පෝෂණය සඳහා දෙයක් නොමැති නම්, ඒ ආකාරයෙන්ම, ඔබේ ඔළුවේ, ඔබේ මනසේ සහ හදවතේ සදාචාරය පෝෂණය සඳහා දෙයක් නොමැත."

**ලුද්විග් ෆෙබාෆ්ග්**



# අලුත් රටක් ගොඩනගන්න රොද බැඳගෙන අපි එනවා!

මෙවර මැයි දින දිනය එළඹෙන්නේ පාලකයන්ගේ මර්දනකාරී වැඩපිළිවෙළ තිව්‍ර කර ජනතාව මත දැඩි පීඩනයක් එල්ල කරන කාල වකවානුවක බව අපි දනිමු. පැය 8ක සේවා කාලයක් ඉල්ලා පාලක පංතියට එරෙහිව අරගල කළ චිකාගෝ කම්කරු සගයින් සමරනු වස් ජාත්‍යන්තර කම්කරු දිනය නිර්මාණය විය. ධනපති පාලකයන් විසින් මර්දනය කළ කම්කරු ජනතාවගේ රක්ත වර්ණ රුහිරය සිහි ගැන්වීම පිණිස රතු ධජ ඔසවමින් 1927 වසරේ පටන් ලංකාවේ ද මැයි දිනය සමරනු ලැබීය. එදා මෙදා තුර ලාංකේය භූමිය තුළ කම්කරු දින සැමරුම් කොතෙක් තිබුණද, ලාංකේය සමාජය තුළ අපරිමිත කැපකිරීම් කළ කම්කරු ජනතාවක් සිටියද බොහෝ විට අපට අත්දකින්නට සිදුව තිබුණේ මැයි දිනයේ සැබෑ අරුත ගිලිහී ගිය සමාජ වටපිටාවකි.
ලාංකේය භූමිය තුළ වැඩකරන ජනතාවගේ කාර්යභාරය නිසි ඇගයීමකට ලක් නොවූ අතීත වටපිටාවක් තුළ වැඩකරන පංතියේ පිරිමින් හා කාන්තාවන්ගේ ලේ, කඳුළු, දහඩිය හා ජීවිතවලට නිසි ඇගයීමක් නොලැබී ගිය බව අපි දනිමු.

රාජ්‍ය හා පෞද්ගලික අංශයේත්, ගොවි, කම්කරු, ගුරු, සෞඛ්‍ය, ඇඟළුම් කම්හල් ආදී ක්ෂේත්‍රවල මෙන්ම පොදුවේ ගත් කළ සමස්ත කාන්තාවම පොදු හා පෞද්ගලික යන පැති ගණනාවකින් පීඩාවට පත්ව තිබෙනු දැකිය හැක.

වැඩ කරන කාන්තාවන්ගේ පැත්තෙන් ගතහොත් වතු කම්කරු කාන්තාවන් මේ වන විට දැඩි පීඩනයකට ලක්ව ඇත. සොච්චම් වැටුපකට තම මුළු ජීවිතයම තේ කහටේ දියකර හරින ඇගේ ජීවිතය තේ දල්ල තරම් සුන්දර නැත. වෙළෙඳ කලාප තුළ රැකියා කරන ඇඟලුම් කම්හල් සේවිකාවන්ද සුවපහසු දිවියක් ගත නොකරයි. ලෑලි කාමරය තුළ ගුලි වී වැඩමුරය තුළ මැෂිමට ජීවිතය දියකර හරින ඇයට ඇතැම් අවස්ථාවල ලිංගික අතවරවලටද ගොදුරු වන්නට සිදුවේ. දවසට එක වේලක් මොනවා හෝ ගිල දමා ඉතිරි කාලය කහට උගුරකින් සැනසෙන්නට සිදුවන විට කවර නම් සැනසීමක් ඇයට උරුමද?

විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුවරියන් ලෙස කටයුතු කරන අයට මේ ප්‍රශ්නයට කිහිප ආකාරයෙකින් මුහුණ දෙන්නට සිදුවේ. ආණ්ඩුව විසින් ගුරුවරුන් මත පටවන පීඩනය, දරුවන්ගේ කුසගින්න, මන්දපෝෂණය, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම්, පවුල් ආරාවුල්, වැනි මෙකී නොකී සියල්ලෙහි බර දරන්නටද ගුරුවරියට සිදුවේ.

පොදුවේ ගත් කළ ආහාර හිඟය, පෝෂණ ඌනතා, පවුල් ආරාවුල්, දික්කසාද, ණය බර, මානසික ආතතිය ආදියෙන් පුරුෂයාට සාපේක්ෂව වැඩිපුර බැට කන්නට සිදුව ඇත්තේ කාන්තාවන්ටය. හම්බ කරන සියලු සේසත බදු හා බිල් වශයෙන් ආණ්ඩුවට දී අත පිසදා
ගන්නට සිදුව තිබීම තුළ ඇති වන මානසික ගැටලු හා චිත්තවේගයන් පිළිබඳ පාලකයන්ට වගේ වගක් නැත.

එවැනි දේ ගැන අනුකම්පා සහගත හදවත් ඇති පාලකයන් මෙතෙක් අපේ රට පාලනය කළේද නැත. තක්කඩි පාලකයන් කාන්තා ඡන්දයෙන් බලයට ඒමට පමණක් බලා හිඳිනු විනා කාන්තාවන්ගේ දුක දකින්නට මෙතෙක් සමත් වූයේත් අනාගතයේ සමත් වන්නේත් නැත.

මෙවර මැයි දිනයේදී එවන් ත්‍රාඩ පාලකයින්ට කාන්තාවන්ගේ බලය, ශක්තිය කෙතරම්දැයි පෙන්වීමට අවස්ථාව උදාවී තිබේ. පළාත් පාලන ඡන්දයට පමණක් නොව ගමේ සමුපකාරයේ ඡන්දයට පවා බියවී හිඳින ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුවට කාන්තා ජවයක් පෙන්වියයුතුව ඇත. කාන්තාවන්ගේ ප්‍රශ්නවලට සැබෑ විසඳුම ඇත්තේ ජ.වි.පෙ. ප්‍රමුඛ ජාතික ජන බලවේගයේ පාලනයක් තුළ පමණකි. එවන් පාලනයක් වෙනුවෙන් කාන්තාවගේ කැමැත්ත ප්‍රබල සාධකයකි. මෙවර මැයි දිනය කාන්තාවන් ලෙස අපට වැදගත් වන්නේ එබැවිනි.

## සටනක පෙරමුණේ නැළවිලි ගී ඇසුණා...

මේකුළු පහව නොයනා වුවනතක මැද
දිදුලන තාරකා නිවුණේ කෙලෙසක ද
නොපෙනෙන ළයක රහසේ සැඟවිලා හිඳ
මහමෙර වුවත් දැඩි නෑ දුක් සුසුම් ලෙද

කම්හල, ගොවිපොළේ මහ මඟ වෙලාවට
දහඩිය හෙළන දුෂ්කර කඳු තලාවට
ගොස් මිරිඟුවක් පසුපස දිය පිපාසෙට
මඟ වැරදුණේ මෙතුවක් කල් කලාවට

ගමටත් කලින් හිරු මුළුතැන්ගෙට කැන්දා
රජුන් තනන්නට ඇය ඉණිමං බැන්දා
වැරදුන තැනදි නොඇඩුව ලබමින් හින්දා
මෙතුවක් කලක් ඇය සතුටින් දුක් වින්දා

කුසින් අඩක් පුරවා කුසගිනි දරපු
නෙතින් තිස් පැයේ දුක් කඳුළුම හෙළපු
අනුන් සතුටු කරනට සැනසුම වරපු
ළඳුන් පෙරමුණේ ඇත, ලෙස අපි හිතපු

කවදත් වගේ මෙවරත් මැයි මල් පිපුණා
වෙනදට වඩා මල් රතු පාටින් පෙනුණා
තුඩ තුඩ නැගෙන සුබ පණිවිඩයක් ඇසුණා
සටනක පෙරමුණේ නැළවිලි ගී ඇසුණා



## ස්ත්‍රී නායකත්වය රටට අවැසි මොහොතක්!

**සමන්මලී ගුණසිංහ** සහෝදරිය
ජාතික සංවිධායිකා,
සමාජවාදී කාන්තා සංගමය
ලේකම්,
අයිතීන් උදෙසා කාන්තාවෝ

වැඩ කරන ගැහැනුන් හා මිනිසුන්ගේ හද පත්ලෙහි ඇති ජාත්‍යන්තර කම්කරු දිනය දිනාගත්තේ ඉතිහාසයේ දහසක් කැපකිරීම් කරමින් ලේ දහඩිය කඳුළු මහ පොළොව මත වගුරුවමින් සටන් කළ වීරෝදාර ගැහැනුන් හා පිරිමින් නිසයි. ලංකාවේ අහිමි වෙමින් යන මානව අයිතිවාසිකම් හා ආණ්ඩුවේ මර්දනයට එරෙහිව වැඩකරන පංතියේ නායකත්වයෙන් යුතු යෝධ බලයක් ගොඩනගා ගැනීම යුගයේ කාර්යභාරයයි.

ගොවි අරගලය හා ගුරු අරගලය තුළ මෙන්ම අනිත් සියලුම අරගලවලදී වැඩ කරන ගැහැනිය හා පීඩාවට පත් ගැහැනිය අරගලයේ ගිනිසිළුව ඉහළින්ම ඔසවමින් හඬ අවදි කිරීම රටේ පාලකයින්ව දැඩි බියෙන් සලිත කළා.

අලුත් ශ්‍රමිකයෙක් ලොවට බිහි කරන ගැහැනියද අනෙකා වෙනුවෙන් මහන්සි වෙමින් වැඩ කරන ගැහැනිය ඩොලර් උත්පාදනය කරමින් ලාංකේය ආර්ථිකය ශක්තිමත් කරන ගැහැනියද පීඩාවට එරෙහිව අලුත් දිශාවක් සඳහා වැඩකරන පංතිය තුළ හා මුළු රටේම බලාපොරොත්තුව සඳහා අත්වැල් බැඳගනිමින් ධෛර්යයෙන් නැගී සිටිය යුතුයි. වැඩකරන ජනතාවට අරගලය කිරීමට අවශ්‍ය නොනවතින ජවය සමාජයේ මහා බලයක් වන ස්ත්‍රී නායකත්වය රටට අවැසි මොහොතක ඔබ වහා එහි පෙරමුණ ගැනීම මැයි දිනයේ කාර්යභාරයයි.

## ඉරානයේ මර්දනය ඉදිරියට




මාහ්සා අමිනි නම් තරුණිය ඉරානයේ සදාචාර පොලිසිය භාරයේ සිටියදී මියයාම හේතුවෙන් එරට කාන්තාවන් සහ තරුණ ප්‍රජාවේ මූලිකත්වයෙන් ඇරඹුන අරගලය ආණ්ඩුවේ මර්ධනය හමුවේ වුවත් තවදුරටත් පවතී. මෙම අරගලය ආරම්භයේ සිට කාන්තාවන් සිය හිජාබය ප්‍රසිද්ධ ස්ථාන වල ඉවත් කර මාධ්‍ය යන්හි පෙනී සිටිමින් අන්තගාමී හිජාබ් නීති සහ සදාචාර පොලිසියට සිය විරෝධතාව පළකරන ලදි. ඉරාන ආණ්ඩුව විසින් මෙම සදාචාර පොලිසිය අහෝසි කළ බව පැවසුවද එය අසත්‍යයක් බවත් ඉරානය ජාත්‍යන්තර ප්‍රජාව නොමග යැවීමට එය සිදුකරන ලද්දක් බවත් එරට අරගලයේ ක්‍රියාකාරීන් සඳහන් කරයි. අරගලය ආරම්භයේ සිට මේ දක්වා කාන්තා පාසල්වල 91 කට ආසන්න ප්‍රමාණයක දැරියන් විෂ වායු වලට නිරාවරණය වී රෝහල් ගත කර ඇති බව වාර්තාවේ. තවද 516 දෙනෙක් පමණ මරණයට පත්වී ඇති බවද වාර්තාවේ.

මෙම විරෝධතා 2022 වර්ෂයේ සැප්තැම්බර් මස මාහ්සා අමිනි නම් තරුණියගේ මරණය සමග ආරම්භ වුවද එය වසර ගණනාවක් තිස්සේ ඉරාන කාන්තාවන් මුහුණ දුන් පීඩනයේ සහ ඉරාන ජනතාව මුහුණ දුන් ආර්ථික පීඩනයේ පුපුරා යාමකි. එම අරගලය මර්දනය හමුවේ වුවද ජයග්‍රහණය දක්වා ගෙන යාමේ අධිෂ්ඨානයක් ඉරාන ජනතාව සතු බව අඛණ්ඩ අරගල තුළින් පැහැදිළි වෙයි.

## ඇෆ්ගනිස්ථානයේ නිදහසට සීමා

ඇෆ්ගනිස්තානයේ කාන්තාවන්ද ඇතුළු ජනතාව තලේබාන් පාලනය යටතේ ඉතා දුක්ඛිත තත්වයක ජීවත්වීමට බල කෙරී ඇත. පෙර පැවති තලේබාන් පාලනය මෙන් අන්තවාදී පාලනයක් සිදු නොකරන බව කියා ගනිමින් බලය අත්පත් කරගත් තලේබාන් කණ්ඩායම් මේ වන විට කාන්තාවන් අධ්‍යාපනයෙන් රැකියාවලින් විතැන් කිරීම පමණක් නොව මේ වන විට තීරණය වී ඇති දික්කසාද අවලංගු කිරීම ආදී අර්ථ විරහිත අන්තවාදී තීරණ ක්‍රියාත්මක කරමින් පවතී. ඉතාම මෑත සිදුවීම වන්නේ කාන්තාවන්ට රිද් සැමරුම තහනම් කිරීමයි.
එක්සත් ජාතීන්ගේ සංවිධානය පසුගිය දා ප්‍රකාශ කළේ ඔවුන්ට අකමැත්තෙන් වුවද ඇෆ්ගනිස්තානයේ පවතින මානුෂීය ආධාර මෙහෙයුම මැයි මාසය තුළ ඉවත් කර ගැනීමට සිදුව ඇති බවයි. එයට හේතුව ලෙස ඔවුන් පෙන්වා දෙන්නේ තලේබාන් සංවිධානය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඇෆ්ගනිස්තාන ජාතික කාර්ය මණ්ඩලයේ කාන්තාවන්ට එහි සේවයට යාම තහනම් කර තිබීමයි. මෙම තීන්දුව වෙනස් කරවා ගැනීම සඳහා තලේබාන් නායකත්වය සමග දිගටම සාකච්ඡා කළද ඔවුන් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවද එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වා දෙයි. මානුෂීය ආධාර සඳහා බඳවා ගත් ඇෆ්ගනිස්තාන කාර්ය මණ්ඩලයේ තුනෙන් එකක් පමණ කාන්තාවන් වන අතර ගණනින් 600කට පමණ ආසන්න වන බව ප්‍රකාශිතය. තවද එක්සත් ජාතින්ගේ සංවිධානය ප්‍රකාශ කරන්නේ දිගින් දිගටම එක්සත් ජනපදය සහ G7 රටවල් ආධාර කප්පාදු කරන බව ප්‍රකාශ කරමින් සිටින බවය. කෙසේ නමුත් පවතින තත්වය තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇෆ්නිස්ථානයෙන් ඉවත්වීම හේතුවෙන් දිනෙන් දින මර්දනයට ලක්වන කාන්තාවන් සහ ගැහැණු ළමුන් තවදුරටත් අවදානම් තත්වයකට පත්වීමේ ඉඩ ඇති අතර මිලියන ගණනක් ජනතාවට ආහාර අර්බුදයකට මුහුණ පෑමටද සිදුවනු ඇත.

# කඩා වැටුණු රට අපි ගොඩනඟනවා

*2023 අප්‍රේල් 07වැනි දින මහරගම තරුණ සේවා ශ්‍රවණාගාරයේ පැවති 'විකිණීම මඟුලක්ද උඟුලක්ද?' සම්මන්ත්‍රණයේදී ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා විසින් පවත්වන ලද දේශනයේ සංක්ෂිප්ත සටහනකි.*

මේ දිනවල ආර්ථිකයේ යම් පිබිදීමක් ගැන සාකච්ඡාවක් පවතිනවා. ණයක් ලැබී තිබෙනවා. ඇතැම් භාණ්ඩවල මිල අඩුවී තිබෙනවා. ජනතාව කල්පනා කරනවා, දැන් අපේ රටේ ආර්ථිකය යම් සුබදායක යම් සුබදායී දිසාවකට යොමු වී තිබෙනවා කියලා. අපේ රටේ ජනතාව මේ ආර්ථිකයේ මේ සුබදායී දිසාව දෙස බලා සිටියේ අද පමණක්ද? අද පමණද අපේක්ෂාවන් තිබුණේ. අපේ රටේ ජනතාව දීර්ඝ කාලයක් ආර්ථිකයේ සුබ සිහිනයක් දකිමින් සිටියා. ආර්ථිකයේ සංවර්ධනය පිළිබඳ සිහින මවාගෙන සිටියා. විටින් විට බලයට ආ පාලක කණ්ඩායම් විසින් ජනතාවගේ ඔළුවේ විවිධාකාරයෙන් මැවීමක් කළා.

## සිංගප්පූරු සිහිනයේ සිට කුණු පොහොර දක්වා

ජේ.ආර්. ජයවර්ධන 77 දී ප්‍රකාශ කළා, ඔහුට බලය දෙන්න, ශ්‍රී ලංකාව සිංගප්පූරුවක් කරනවා කියලා. විශාල ගොඩනැගිලි, විනයක් සහිත රටක්, විශාල පාරවල්, තරුණ තරුණියන්ට රැකියා, රටේ නිෂ්පාදනය ඉහළ යාම, වරාය, ගුවන් සේවය, බැංකු සේවය කාර්යක්ෂම සිදුවෙන රාජ්‍යයක් පිළිබඳව ඔළුවේ මැව්වා. අද සිංගප්පූරුවේ වසරක සමස්ත ආර්ථිකයේ වටිනාකම ඩොලර් බිලියන 424යි. ලංකාවේ වසරකට නිෂ්පාදනය කරන්නේ ඩොලර් බිලියන 65යි. ඒ 2022 වසරේ. සිංගප්පූරුවේ ඒක පුද්ගල ආදායම ඩොලර් 79,500යි. ලංකාවේ ගිය වසරේ ජාතික නිෂ්පාදිතය අනුව ඩොලර් 3000ටත් වඩා ටිකක් අඩුයි. 1994 දී චන්ද්‍රිකා කුමාරතුංග, මේ විවෘත ආර්ථිකය අපේ රටට මහත් විනාශයක් ළඟා කළ බවත් අපරාධ, දූෂණ, නීතිගත වුණු, රාජ්‍යයක් ඇති වුණ බවත් කිව්වා. විවෘත ආර්ථිකයට මානුෂික මුහුණුවරක් දීමට අවශ්‍ය බව ඇය ප්‍රකාශ කළා. ජනතාව සිතුවා රටේ යහපත් තත්වයක් නිර්මාණය වෙයි කියලා. ආර්ථිකයේ විශාල වර්ධනයක් ඇති වේවි, තාක්ෂණය උපයෝගී කරගෙන දියුණු කර්මාන්ත ශාලා පද්ධතියක් ආරම්භ කරාවි කියලා. මානුෂික ආර්ථිකයක් ගොඩනගාවි යැයි ජනතාව විශ්වාස කළා. එහි ප්‍රතිඵලත් අතිශය නීරස වුණා.

නැවත 2005දී 'රට පෙරට' මාතෘකාව ගෙනඑමින් මහින්ද රාජපක්ෂ රට ඉදිරියට ගෙනයාමට වැඩපිළිවෙළක් ඉදිරිපත් කළා. නමුත් එය බිඳ වැටුණා. 2010 දී ආසියාවේ විස්මයජනක රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාව පත්කරන බව පැවසුවා. ජනතාව ඒ සුබ සිහිනය ඔස්සේ ගමන් කළා. ඊට පසුව රනිල් වික්‍රමසිංහ 'යහපාලනය' ගොඩනගන බවට ජනතාවට පොරොන්දු වෙමින් පැමිණියා. ජනතාව ඒ සුබ සිහිනය ඔස්සේ විශ්වාසය තබාගෙන සිටියා. ඉතිහාසයේ එක ආණ්ඩුවක් ලබාගත් වැඩිම ණය තොගය සහිත රට බවට රනිල් වික්‍රමසිංහ පත්කළා. රනිල් වික්‍රමසිංහ 2015 සිට 2019 දක්වා වසර 04ක කාලය තුළ ඩොලර් බිලියන 12යි, මිලියන 50ක් ලබාගනිමින් ලංකා ආණ්ඩුව ලබාගත් වැඩිම ණය තොගය සහිත රට බවට පත් කළා. ඔහු ජාතික සම්පත් විකිණීමට පටන් ගත්තා. ජනතාව යහපාලනයත් මිරිඟුවක් බව තේරුම් ගත්තා. ඊට පසුව ගෝඨාභය රාජපක්ෂ දියුණුතම මෙවලම් උපයෝගී කරගන්නා රටක් නිර්මාණය කරන බව පැවසුවා. නමුත් අවසානයේ චීනයේ කුණු පොහොර ලංකාවේ කුඹුරුවලට ගහන තත්වයක් නිර්මාණය කර බැස ගියා.

## නැවතත් ණය මාවතට

දැන් නැවත මේ රට ගොඩයාමේ ඒකායන මාර්ගය මූල්‍ය අරමුදලෙන් ණය ගැනීම බවට ආණ්ඩුව විශාල මාධ්‍ය මෙහෙයුමක් දියත් කර තිබෙනවා. නමුත් මේක ණයක්, මෙය රැවටීමක්, මේ මාවතේ ගමනක් නොමැති බව ජනතාව තේරුම් අරගෙන තිබෙනවා. මෙම ණය ලබාගැනීමේ එකඟතාවය ජයග්‍රහණය කළේ කවුද යන්න බෙදා ගැනීමටත් තරග කරමින් ඉන්නවා. මේ එකඟතාවයේ කුසලානය හිමි බැසිල් රාජපක්ෂට බව ඒ පැත්තෙන් ප්‍රකාශ කරනවා. රටකට ණයක් ලබාගැනීමේ කප් එකේ හිමිකාරිත්වයට පොර බදමින් තිබෙනවා. මේ තුළ ජනතාවට බලහත්කාරයෙන් ඇතුල් කරන්න හදනවා මේක තමයි යා යුතු මාවත බවට.

මේක ඇත්තද? නැහැ. මේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟතාවයකට යන්න සිදුවුණේ මහ බැංකු අධිපති නන්දලාල් නිසයි. ඔහු මහ බැංකු අධිපති ලෙස පත්කරන්නේ 2022 අප්‍රේල් මස 08 වෙනි සිකුරාදා. නිවාඩු දින තුනකට පසුව ඔහු අප්‍රේල් 12වන දින මහ බැංකුවට පිවිසුණා. ඔහු මහ බැංකු අධිපති ලෙස පළමුවෙන්ම ගත් තීන්දුව තමයි ශ්‍රී ලංකා රජය විදේශීය රටවලින් ලබාගත් ණය ගෙවන්නේ නැති බවට ගත් තීරණය. මහ බැංකු අධිපතිවරයෙක් ගොඩවූ පළමු දවසේම එවැනි තීන්දුවක් ගැනීමට තරම් එහි කිසියම් අන්තර් සම්බන්ධතාවයක් තිබෙන බව පැහැදිලියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වැනි වගන්තිය අනුව රටේ මූල්‍ය බලය මුළුමනින්ම පැවරෙන්නේ පාර්ලිමේන්තුවටයි. 2021 දෙසැම්බර් මාසයේ අයවැයෙන්, 2022 වසරේ ණය ගෙවීම සඳහා මුදල් වෙන්කර තිබුණා. එහි නිශ්චිතව සඳහන් කර තිබුණා ගෙවීමට තිබෙන ණය මුදලත්, එම ගෙවීමට තිබෙන ණය මුදල් සඳහා මුදල් සොයා ගන්නා ආකාරයත්. හැබැයි කැබිනට් මණ්ඩලයට හෝ පාර්ලිමේන්තුවට කිසිදු අවබෝධයකින්, දැනුවත් කිරීමකින් තොරව මහ බැංකු අධිපතිවරයා තීන්දුවක් ගන්නවා අපි ණය ගෙවන්නේ නැහැ කියලා. සමහර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් ලෙස පෙන්වා දුන්නා.

රටක් ණය ගෙවන්නේ නැතැයි කියන්නේ රට බුන්වත්භාවය ප්‍රකාශ කිරීමක්. ණය ගෙවන්නේ නැත්නම් අනිවාර්යයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමග එකඟතාවයකට යා යුතුමයි. වෙනත් කිසිදු විකල්ප මාවතක් නැහැ. අපිට මුදල් සපයා ගැනීම වෙනුවෙන් ද්විපාර්ශ්වික එකඟතාවයන් වෙත යා හැකිව තිබුණා. 2022 අගෝස්තු මාසය වන විට 2022 වසර සඳහා පමණක් ඉන්දියාවෙන් ඩොලර් 3.8ක ණය පහසුකම් අරගෙන තිබුණා. තවදුරටත් සාකච්ඡා දීර්ඝ කර ණය පහසුකම් ලබාගැනීමට අවස්ථාව තිබුණා. අපි හදාග න්නා සංවර්ධන මාවත්වලට අනුරූප වන පරිදි ඉන්දියාවත් සමග ණය එකඟතාවයකට යා හැකිව තිබුණා. පසුගිය මාර්තු මස ඩොලර් බිලියන 1.5ක් වටිනා යුවාන් ණය මුදලක් ලබාදී තිබෙනවා. අදත් එය මහ බැංකුවේ සංචිතවලට ඇතුළත් වෙලා තිබෙනවා. අපි ණය නොගෙවන්නේ නම්, ද්විපාර්ශ්වීය ගනුදෙනු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අවස්ථාව ඇහිරී යනවා. මේ අර්බුදයෙන් ගොඩඒම සඳහා ජපානයත් සමග යම් මුදල් ගනුදෙනුවක් පිළිබඳව සාකච්ඡා කරමින් තිබුණා. අපි ණය ගෙවන්නේ නැත්නම් ණය ගෙවන්නේ නැති රටකට කිසිවෙක් ණය දෙන්නේ නැහැ. ආසියානු සංවර්ධන බැංකුවෙන් අපට ණය ලබාගැනීමේ



ජාතික ජන බලවේගයේ නායක
**අනුර කුමාර දිසානායක සහෝදරයා**

හැකියාව තිබුණා. ඒ සියල්ල අප්‍රේල් මාසයේ 12වැනිදායින් පසුව ගිලිහී ගියා. මහ බැංකු අධිපතිවරයා අප්‍රේල් මස 12වැනිදා ගත් තීරණයත් සමග අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමග ගැටගැසුවා. මෙය ඉතාමත් දැනුවත්භාවයකින් කරන ලද කාර්යයක්. ඔහු එම පුටුවේ වාඩිවෙන ලද්දේ එම කාර්යය සඳහාමයි යන මතය සමාජය තුළ මතුවී තිබෙනවා.

වසර 04ක කාලය සඳහා ඩොලර් බිලියන 2.9ක මුදලක් ලැබෙනවා. මාස හයෙන් හයට ඩොලර් බිලියන 320කට ආසන්න මුදලක් අපට ලැබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග යන මේ ගමන අපේ රටට අලුත් ගමනක් නොවේ. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් පළමු ණය පහසුකම ලබා ගන්නේ 1966 වසරේදී. 66 සිට 2016 දක්වා අපි දහසය වතාවක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය පහසුකම් ලබාගෙන තිබෙනවා. මේ අවස්ථාව සමග අවස්ථා හතරක් අපි ණය ලබාගෙන තිබෙන්නේ විස්තීරණ පහසුකමක්. එයින් අදහස් කරන්නේ එයාලා දෙන ලද න්‍යාය පත්‍රයකට අනුව එසේ නැත්නම් එයාලා සමග වෙන එකඟතාවයකට අනුව ආර්ථිකය මෙහෙයවීම.

## ස්වෛරීභාවය අහිමි කර ගනිමින්

මෑතකදී වෘත්තීයවේදීන්ගේ සංවිධානයක් වෛද්‍යවරු, ඉහළ කළමනාකරුවන්, විශ්වවිද්‍යාල ආචාර්යවරු ඉහළ බදු කප්පාදුවට ලක්වූ අය ජනාධිපතිවරයාත් මුදල් අමාත්‍යාංශයේ ලේකම් සිරිවර්ධනත්, මහ බැංකු අධිපති නන්දලාල් සමගත් සාකච්ඡාවක් පැවැත්වූවා. එහිදී වෘත්තීයවේදීන් උපයන විට ගෙවීමට සිදුව ඇති බදු මත ජීවිතය පවත්වාගෙන යාමට අපහසු බැවින් ඔවුන්ගේ බදු ලෙස කපා ගන්නා මුදල අවම කර එම මුදල් බැංකුව වෙත ලබාගත හැකි විකල්ප මාර්ගයක් ඉදිරිපත් කළා. ජනාධිපතිවරයාත්, මහ බැංකු අධිපතිවරයාත් එහිදී එය පිළිගත් අතර, ඔවුන් කියා තිබුණේ මෙයට තමන්ට විසඳුමක් දිය නොහැකි බවයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමග සාකච්ඡාවක් අරගෙන දෙන්නම් එයාලට ඔය ගැටලුව ඉදිරිපත් කරන්න කියලා ඔවුන් කියා තිබුණා. එයින් කියන්නේ තවදුරටත් මේ ආර්ථිකයේ තීන්දු තීරණ ගැනීමේ හැකියාවක් ජනාධිපතිවරයාට හෝ මහ බැංකු අධිපතිවරයාට නැති බවයි. අපට අපේ ආර්ථික ස්වෛරීභාවය අහිමි වී තිබෙන බවයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මෙහි අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් තිබෙනවා. එකක් ගෙවුම් ශේෂය තුලනය කර ගැනීම. එයාලට මේ ප්‍රශ්නය ගෙවුම් ශේෂය තුලනය කර ගැනීමේ ප්‍රශ්නයක්. මෙය ආර්ථිකයේ අභ්‍යන්තරයේ ඇති වන ගැටලුවක්. ලෝක වෙළඳපොළ වෙනස්වීම්වලට අනුව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කර අපනයන ආදායම වැඩිකර ගැනීමට සැලැස්මක් තිබුණේ නැහැ. අපේ ආර්ථික දේහයේ ඇති වී තිබෙන කුණුවීමට ගිණුම්කරණ විසඳුමක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යෝජනා කරනවා. දෙවන කරණය, ආණ්ඩුවේ අයවැය හිඟය තුලනය කරගන්නේ කෙසේද? ගිය වසරේ භාණ්ඩාග ාරයට ලැබුණා රුපියල් කෝටි ලක්ෂ දෙකක්. මේ වසරේ ණය පොලී වාරිකය ට්‍රිලියන 2.2යි. ණය වාරිකය ට්‍රිලියන 2යි. මේ වසරේ ණය පොලී වාරිකය ගෙවීමට ට්‍රිලියන 4.2ක් අවශ්‍යයි. මෙම හිඟය ගිණුමේ තුලනය කර ගැනීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් උපදෙස් දෙනු ලැබුවත්, ආර්ථික දේහයේ ඇතිවන ගැටලුවලට පිළිතුරක් නැහැ. සමාජ යාන්ත්‍රණයට පිළිතුරක් වන්නේ නැහැ.

මේ ප්‍රශ්නය ගිණුම්කරණයෙන් බේරිය නොහැකියි. අපේ රටේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ඇති සැලැස්ම කුමක්ද? ඔවුන්ගේ ඊළඟ යෝජනාව වන්නේ 2025 වන විට විදෙස් සංචිත ඩොලර් බිලියන 10.3කට ගේන්න. ඉතිහාසයේ කිසිදිනෙක සිදු නොවූවක්. වැඩිම 8.3ක් තිබුණා 2014-2015 කාලයේ. විදෙස් සංචිත වැඩිකිරීමට කළ යුත්තේ කුමක්ද? අපි උපයා ගන්නා ඩොලර් ප්‍රමාණය අපේ අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි වූ විට ඒවා සංචිතවලට එකතු වෙනවා. දැන් විදෙස් සංචිත නිර්මාණය කිරීමට අපේක්ෂා කරන්නේ ශ්‍රී ලංකා ගුවන් සමාගම, ශ්‍රී ලංකා ටෙලිකොම්, කොළඹ හිල්ටන් හෝටලය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ ඒවායේ පාලිත සමාගම් - ලංකා හොස්පිට්ල්, ෂෙල් ගෑස් සමාගම් - ප්‍රතිව්‍යුහගත කිරීම මගිනුයි. සරලව ගත හොත් විදෙස් සංචිත වැඩිකර ගැනීමත්, ගෙවුම් ශේෂය තුළනය කර ගැනීමත්, අයවැය හිඟය තුළනය කර ගැනීමත් සඳහාත් විකල්පය වන්නේ විකිණීම සහ ණයට ගැනීමත් යන ක්‍රියාමාර්ග දෙක පමණයි.

## ඊ.පී.එෆ්. අවදානම

මේ ව්‍යාපෘතිය අවසන් වන විට වසර පහ තුළ අයි.එම්.එෆ්. එකෙන් ගන්නවා ඩොලර් බිලියන 2.982ක්. ලෝක බැංකුවෙන් ගන්නවා මිලියන 1750ක්. ආසියානු සංවර්ධන බැංකුවෙන් ගන්නවා මිලියන 2000ක්. තව බහු පාර්ශ්වික සහ ද්විපාර්ශ්වික ණය ගන්නවා බිලියන 10.283ක්. ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර විකුණනවා බිලියන 3.75ක්. තව අපේක්ෂා කරනවා ඩොලර් බිලියන 20ක ණයක්. ඒ ණයවලින් ඩොලර් බිලියන 13ක් ණය ගෙවනවා. අපිට ගෙවීමට තිබෙනවා ඩොලර් බිලියන 27ක්. ඒ ඩොලර් බිලියන 27න් ඩොලර් බිලියන 14ක් කපා හරීවි යැයි අපේක්ෂා කරනවා. මුළු වසර හතරටම බිලියන දාහතරයි දශම ගණනක් කපා හැරිය යුතු වෙනවා. දැන් සාකච්ඡාවක් පැමිණ තිබෙනවා ඒ මුදල කපා හැරීමට නම්, දේශීය ණයත් ප්‍රතිව්‍යුහගත කිරීමකට ලක් කිරීමට වුවමනා බව. දේශීය ණය ට්‍රිලියන 12ක් තිබෙනවා. එයින් කෝටි ලක්ෂ තුනක් ඊ.පී.එෆ්. එකේ සල්ලි. මේ රටේ වැඩකරන ජනතාව තමන් වැඩකරන වැටුපෙන් මාසිකව 8%ක් කපලා, ස්වාමියා 12% ක් දීලා මාස්පතා කැපෙන සල්ලි. ඒ කැපෙන සල්ලි සේවක අර්ථසාධක අරමුදල ආයෝජනය කරනවා. එය ආයෝජනය කළ හැක්කේ කොටස් වෙළඳපොළේ. එය 7%ක් පමණයි. අනෙක්වා භාණ්ඩාගාර බිල්පත්වල, භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කරනවා. ආණ්ඩුවට ණයට දී තිබෙනවා කෝටි ලක්ෂ තුනක්. එම ණය කපා හැරියහොත් මහජනතාවගේ මුදල් කෝටි ලක්ෂ එකහමාරක් අහිමි වෙනවා. අද වාණිජ බැංකු පද්ධතිය ද්‍රවශීලතාවයේ අනතුරකට මුහුණ දී තිබෙනවා. ආණ්ඩුවට ණය දීමෙන් මේ තත්වය උදාවී තිබෙනවා.

මහ බැංකුව යනු සේවක අර්ථ සාධක අරමුදලේ භාරකාරයා. එයාලා තවත් යෝජනාවක් ගේනවා මහ බැංකුව ස්වාධීන කළ යුතු බවට. පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට තිබෙනවා. එහි වගන්ති 46ක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැණි බවට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් දී තිබෙනවා. රජයෙන් මහ බැංකුව මුළුමනින්ම ස්වාධීන කළ යුතු බවට මේ පනතින් යෝජනා

11 වැනි පිටුවට

# පොලිටිකල් පංතිය

පොලිටික්ක සෑහෙන දවසක් පංතියට ආවෙ නෑ. කවුරුවත් පාරක තොටකවත් දැකල තිබුණෙත් නෑ. අහම්බෙන් ගෙවල් පැත්තෙ ගිය ළමයෙක් දැකල තිබුණෙත් ගේ වහල දාල තියෙන බවක්. එක ගුරුවරයෙක් නම් කාට හරි කියල තිබුණා පොලිටික්ක ආයෙ එයි කියල. එත් හරි ආරංචියක් ආවෙ නෑ.

"දැන් අපේ සර් මාරු වෙලා ගිහිල්ලද?" කනියට ඩෙස් එකේ නිදාගෙන ඉඳල ඇති වෙලාද මන්ද?

"කොහේ මාරු වෙන්නද? අපිට කිවුවෙත් නෑනෙ" අනුරුද්දිය අදහගෙන ඉන්නෙ පොලිටික්ක හැම දේම එයාට කියල කරනවා කියල.

"අනේ සර්ට සනීප නැද්ද දන්නෙ නෑ... බලන්න යන්න තැනක් දන්නෙත් නෑනෙ" වසන්තිය ගවුමෙ උරෙස්සෙ හොටුත් පිහදානව. " නෑ මං කිවුවෙ සර්ම නෙමෙයි, ගෙදර කාට හරි කරදරයක්ද දන්නෙ නෑනෙ" ඇත්තටම මුකුත් වෙයි කියල හිතල වසන්තිය කිවුව එකේ සැරත් බාල කළා.

"කලබල වෙන්න දෙයක් නෑ. සර් මේ දවස් ටික පහුවෙලා එයි" සමන සංසුන්ව බරසාරව කිවුව තාලෙට ඇහුණු හැමෝම දැන ගත්ත සමන යමක් දැනගෙන ඉන්නව කියල.

"අෑ සමනො උඹ දන්නව නේද? ඉතින් කියපන්කො සර්ට මොකද වෙලා තියෙන්නෙ කියල" චමිය සමන පස්සෙ වැටුණා.

"අයියෝ සමන් දන්නව නම් කියන්නකො... අපිට මොනව බේර ගන්න බැරිද?" වැඩි දෙනෙක්ගෙ ඉල්ලීම මැද්දෙ සමනට සුපර් ස්ටාර් වටිනාකමක් ලැබුණා. "දැන්නම් ඕක කියන පොරොන්දුවටම මටත් ඡන්දෙ ඉල්ලන්න පුළුවන් වගෙ..." සමන මූණට පැත්තෙන් අත් එකතු කරලා කපටි හිනාවත් එක්ක කැරකිලා ආයුබෝවන් පාරක් දැම්ම.

"ඇත්ත කියපන්... සර් ඡන්දෙ ඉල්ලනවද?" මංජුව සමනගෙ ඇස් දෙක ඉස්සරහට පැනල කණාවට ඇහුව.

"දැන් උඹ මං ඉල්ලුවොත් මට ඡන්දෙ දෙනවද?" සමන මංජුවගෙ බෝලෙ මඟ ඇරිය.

"උඹට ඡන්දෙ ඉල්ලන්න බෑනෙ. දැන් ළමා පාර්ලිමේන්තු ජහුටාව නෑනෙ" මංජුව ගේමම ඉල්ලනව.

"හරි සමන් කියන්නකො... ඔයා පාර්ලිමේන්තුවට ඉල්ලනකොට. මට ඡන්දෙ දෙන්න වෙන්නෙ එතකොට" අල්ලපු ගමේ බස්සා කිවුව.

"මොකො කියන්න බැරි කේස් එකක්ද?" චමිය සමන වටේ යන ගමන් අහනව, "හොරෙන්ද ඡන්දෙ ඉල්ලන්නෙ... ඡන්දෙට නිවාඩු ගන්නෙ නැතුව"

"නෑ... මං හිතන්නෙ එහෙම එකක් නෙමෙයි.... එක්කො ඕනෙ නෑ" සමන කතාව වහනව කියල හැමෝටම තේරුණා... "මගෙන් ඉල්ලුවත් එක්ක කියන්න එපා කියල..."

"හරි... සර් ගැන මුකුත් ඔයා අපිට කියන්න එපා. ඔයා දැකපු දේයි, එයා ඔයාට එයා කිවුවෙ දේයි විතරක් කියන්නකො..." බලන්න ඕනෙ වසන්තිගෙ ඇස් දෙක සමන දිහා බලපු.


"මගෙන් අලුතෙන් විස්තර නෑ. දැකපු දේ කියන්නම්... මං ලොකු නැන්දලගෙ දානෙ ගෙදර ගිහින් හිටපු දවසක වයසක ඩබලක් වටපිට බල බල ගේට්ටුවෙන් වත්තට ආවා. මං ජනේලෙන් දැක්කෙ යන්තමට. මං හිතුව දානෙ වැඩකට එනව වෙන්න ඇති කියල. ටිකක් වෙලා නැන්ද එක්ක කතා කර කර ඉඳලා එක්කෙනෙක් කොළයක් දික්කළා. නැන්දට මල පැනල බණින්න ගත්ත. ඒ ගමන මාත් හොඳට බැලුව. කෙනෙක් පුරුදුයි. කතාව උස් වෙනකොට පොලිටික්කගෙ වගේ. මමත් එළියට බැස්සා. 'බලන්නකො පුතේ මුන්ට තවත් ලැජ්ජ නෑනෙ. අපෙන් ඡන්දෙ ඉල්ලන්න එන්න' නැන්දගෙ කට ඇවිස්සුණාම දන්නෙ නැද්ද..." "අයියෝ... සර්ට වුණ දෙයක්...' ළමයින්ගෙ ඒ හීල්ලුමට අහු වුණානම් හුණු කොට්ටෙත් නහයට ඇදෙනව.

"පොලිටික්ක මාව දැක්ක ගමන් නිදහසට කියාගෙන ආපු ඒවා ආපහු ගිලුණා. මට පවු කියල හිතුණා. මං නැන්දට කිවුව 'මේ අපේ පොලිටිකල් සර්' කියල. 'අනේ මන්ද දේශපාලනේ දන්නවයි කියල හිතන මිනිස්සුත් මෙහෙම අඳ බාල ...' නැන්දා තවත් මොනවද කියාගෙන ගෙට ගියා. පොලිටික්ක හිමීට මට කිවුව එයා ඡන්දෙ ඉල්ලන කතාව කියන්න එපා කියලා. 'හැම ගෙදරටම ගියෙත් නෑ... මෙතනින් පස්සෙ කොහොවත් යන්නෙත් නෑ... මිනිස්සු ගහන්න පන්නව... ළමයො දැන් මං ඉන්නෙ දාපු මෝඩකමට' කියල මං දිහා බලන් ඉඳලා නැන්ද ගුලි කරලා විසි කරපු කොළ කීපෙකකුත් ඇහිඳගෙන දෙන්නත් එක්ක යන්න ගියා...

"සිද්ධිය ඔච්චරයි. ඔයාලට මං මුකුත් කිවුවෙත් නෑ. ඔයාලට මං මුකුත් කියනව ඇහුණෙත් නෑ. පොලිටික්ක ආයෙ ආපුවම මේ ගැන කාගෙන්වත් වචනයක්වත් පිටවෙන්නත් බෑ... මට පොලිටික්ක ගැන දුකයි." සමන කට්ටියගෙන් පොරොන්දුවකුත් ගත්තා.

## කවුළුව හැරමි තබමි

# අලුත් ලොවක ආස්වාදය විඳ ගමු...



ඔවුහු නිර්පාක්ෂික නොවූහ. ඒ වෙනුවට පංතියට පාක්ෂික වූහ. අරගලයෙන් පසු ඔවුන් එක එක ධනේශ්වර ගුබ්බෑයම්වලට රිංගීමට ගියේ නැත. තම අවස්ථාවාදී ජීවිත පැවැත්ම වෙනුවෙන් ධනපති නායකයන් වනා තම ජීවිත ආරක්ෂාව තහවුරු කර ගැනීමට ගියේ නැත. ඒ වෙනුවට අරගලයේ නායකයින් ඇතුළු සිය දහස් ගණනක් තම උත්තුංග අරමුණ වෙනුවෙන් දිවි පිදීම තෝරා ගත්තෝය. අදටත් පැය 08ක වැඩ දිනය ලොව පුරා කම්කරුවන් භුක්ති විඳින්නේ ඔවුන්ගේ ඒ උසස් පරමාර්ථය වෙනුවෙන් කළ අමිල පරිත්‍යාග නිසාය. ඔවුහු නම් චිකාගෝ මැයි විරුවෝ වන්නේය.

ලොව පුරා කිසිදු ජාති, ආගම්, කුල වර්ග, වර්ණ භේදයකින් තොරව සමරනු ලබන මැයි දිනය ලොව සුවහසක් කම්කරු, පීඩිත ජනතාවට උරුමකර දීමට මුල් පියවර තැබවේ එදා ඒ චිකාගෝ විරුවන්ය. එසේ සමරනු ලබන්නා වූ එකම දිනය මැයි දිනයම වන්නේය.

අද ලාංකේය දේශපාලනය තුළ ගත්කළ මැයි දිනය කොතරම් කෙළෙසනු ලැබ ඇත්ද යන්නට ධනපති පාලකයන්ද වෛවර්ණයෙන් එය ව්‍යාජ සැමරීම්වලට ලක්කරන අන්දමින්ම ඔබට පෙනී යනු ඇත.

අද සකල පීඩිත කම්කරු ජනතා අරගලයේ එක අභියෝගයක් වන්නේද මැයි දිනයේ සැබෑ අරුත, ඇත්ත උරුමය එහි සැබෑ උරුමක්කරුවන් සතුකර ගැනීමේ දේශපාලන අරගලයයි.


මෙවර මැයි දිනය පීඩකයන් අනිත් පීඩිත මහා ජනතාවගේ අභිලාෂයන් ඉටුවන බල හුවමාරු සටනේ ආරම්භක පියවර ලෙස භාවිතයට ගැනීම ලාංකේය වැඩකරන ජනතාවගේ සහ ඊට නායකත්වය දෙන සමාජ ව්‍යාපාරයේ මූලික අරමුණ බව පැහැදිලි වෙමින් තිබීම ලාංකේය ජනතාව අලුත් ලොවක ආස්වාදය විඳීමට සූදානම් විමකි.

# කළුකබා ත්‍රස්තයා!


1979 අංක 48 ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනත ඔබට මතකද? ජේ.ආර්. රටේ ජාතික ආරක්ෂාවට යැයි කියමින් එය ගෙනාවේම අයුක්තියට, අසාධාරණයට, ආර්ථික පීඩනයට එරෙහිව නැගී සිටි ජ.වි.පෙ. ප්‍රමුඛ පීඩිත ජනයා මර්දනයට බව දැන් හොඳටම පැහැදිලිය. 1953 හර්තාලයේදී ඩඩ්ලිලා, කොතලාවලලා 'මාර්ෂල් ලෝ' ගෙනාවේද හදිසි නීති, මර්දන අනපනත් ගෙනාවේද එවැනිම පීඩිත ජනතා අරගල මැඩලීම සඳහාය. දැන් ඒ අතීත වියරු අවතාරවල වත්මන් පුරුක වන රනිල්ද උත්සාහ කරමින් සිටින්නේ රටේ ජාතික ආරක්ෂාවට යැයි කියමින් දැනටමත් තිබෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට අලුත් නමක් යොදාගෙන ත්‍රස්ත විරෝධී පනත නමින් තම පැරණි පාලකයන් අතට ගත් මර්දන අවිය තවත් මුවහත් කරමින් සුපුරුදු ජනතා මර්දන පිළිවෙත ඉදිරියට ගෙන යාමටය.

ආණ්ඩුව සහ එහි ගැත්තන් පවසන්නේ මෙය එවැන්නක් නොවන බවත් රටේ ජනතාවගේ සහ ජාතික ආරක්ෂාව ගැන සිතා ගෙන එන පනතක් බවය. ඒ අර පරණ පාලකයන් ගැයූ ගීතයමය. නමුත් ගොනා හැරෙමින් සිටින්නේ කුමකටදැයි රටේ හිතන මතන ජනතාවට නම් තේරුම් ගත නොහැකි දෙයක් නොවේ.

ජාතික ආරක්ෂාව සහතික කළ හැකි රටේ සියලු ආර්ථික මර්මස්ථාන විදෙස් රටවල සමාගම්වලට විකුණමින්, රටේ ගෙල තව තවත් සිරකරලීමට පැත්තකින් ක්‍රියාත්මක වන රනිල්-රාජපක්ෂ නඩයේ මේ විනාශකාරී ගමන වහාම නතර කළ යුතු නොවේද? ප්‍රමාද වන දිනක් පාසා රටේ පීඩිත ජනතාව ත්‍රස්තවාදීන් බවට පත්වනු ඇත. රනිල්ලාගේ අර්ථ නිරූපනය අනුව ඔබ ත්‍රස්තවාදියෙකු වී මිය යාමට හෝ සිර ගත වී සිටීමට කැමති නම් ඔහේ කරබාගෙන ඉන්න. ඊට අකමැති සියලු දෙනා මේ මෘග වියරු ත්‍රස්තවාදියාගෙන් රටත් ජනතාවත් මුදා ගැනීමට ප්‍රමාද නොවී ඉදිරියට එන්න.




# නව ලිබරල් පෙට්ටගම




දවසක් නස්රුදීන්ගේ ගේ ඇතුලේ මොකක්ද ශබ්දයක් ඇසුණා. නස්රුදීන් ඒකට හොඳටම බයවෙලා පෙට්ටගම ඇතුළේ හැංගුණා.

ආවේ හොරු දෙන්නෙක්. ඔවුන් ගේ පුරාම වටිනා කියන දේ හෙව්වා. අවසානයේ ආවේ පෙට්ටගම ගාවට. ඒක ඇරියා හොරු දෙන්නා දැක්කෙ ඒක ඇතුලේ හිටිය නස්රුදීන් විතරයි. වෙන මොකුත් තිබුණෙ නැහැ. "මොනවාද තමුසෙ අපෙන් හංගන්න හදන්නේ?" එක හොරෙක් ඇහැව්වා.

"මොකුත් හංගන්න හැදුව නොවෙයි. මං හැංගුණා. මේ ගෙදර ඔහෙලට ගෙනියන්න තරම් වටිනා දෙයක් නැති බව මතක් වෙලා මට ලැජ්ජා හිතුණා." නස්රුදීන් කිවුවා.

අද රනිල්-රාජපක්ෂලා විසින් ඉදිරියට ගෙන යමින් සිටින කොල්ලකාරී නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය තවදුරටත් ඉදිරියට ගෙන ගියහොත් අපේ රටේ අහිංසක ජනතාවටත් උරුම වෙන්නේ අර නස්රුදීන්ට අත්වුණු ඉරණමය. අවසානයට සිදුවන්නේ හිස් පෙට්ටගමක සැඟවී ගැනීමටය. ඔවුන් තම කටයුතු හමාර කරලනුයේ රටේ සියලු සම්පත් ජනතාවට අහිමි කරලූ පසුය.

සමාජවාදය යථාර්ථයක් නොවේ ඒකෙන් ප්‍රශ්න විසඳීමට නොහැකිය. යථාර්ථය වන්නේ ධනවාදයයි; නව ලිබරල්වාදයයි; ප්‍රශ්න විසඳීමේ එකම මඟ පෞද්ගලීකරණයයි කියමින් මේ අර්බුදයට ප්‍රත්‍යක්ෂ විසඳුම ලැබී ඇතැයි කියමින් රනිල්ලාගේ ආර්ථික ප්‍රතිපත්තිය ඍජුව හා වක්‍රව වනමින් උඩ පනින වන්දි භට්ටයන්ගේ ජඩ දේශපාලනයට අසුවුණහොත් රටේ ජනතාවට සිදුවන්නේ නිර්පාක්ෂිකව නොව නිර්වස්ත්‍රව අවසන් ගමන් යාමටය.

2023 අප්‍රේල් 25

# තව අවුරුදු තුන හතරකින් X-Press Pearl නැවේ වන්දිය ගැන උත්තර බඳින්න කවුරුවත් මෙතන නැහැ

*(අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත පිළිබඳ විවාදයට එක්වෙමින්)*

## ජාතික ජන බලවේගය පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත මීට බොහෝ කලක සිට පෙර පටන් සාකච්ඡා වෙමින් පැවති දෙයක්. විශේෂයෙන්ම අපේරටේ සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීම සඳහා නීතිය ශක්තිමත්ව ක්‍රියාත්මක විය යුතුයි. ඒ පිළිබඳව අපේ කිසිදු විවාදයක් නැහැ.

අධිකරණ අමාත්‍යාංශය යටතේ මේ නීති අද ගෙනෙන අවස්ථාවේදී මුළු රටම ගිනිඅරගෙන තිබෙනවා මේ X-Press Pearl, New Diamond නෞකා දෙකත් එක්ක. ඇත්තටම X-Press Pearl නැව ගිනි ගත්තා. ඒ ගිනි ගත්තාට පස්සේ අද මුළු රටම ගිනි අරගෙන තිබෙනවා, ඒකට ලැබිය යුතු වන්දිය සහ දඩය නොලැබීමත් එක්ක.

අධිකරණ ඇමතිතුමා උදේ පැහැදිලි කරද්දී කිවුවා, මේ විශේෂඥ කමිටුවට චන්දන ජයසූරිය, ඩැන් මලික් ගුණසේකර, රොනල්ඩ් පෙරේරා නීතිඥවරු හිටිය කියලා. මගේ අවබෝධය හැටියට රොනල්ඩ් පෙරේරා සහභාගි වෙලා නැහැ. නමුත් අවසන් වාර්තාවට අත්සන් කරල තියෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් මැදිහත්වෙච්ච විකුම් දාබරේ මහත්මයා, නයෝමි කහවිට මහත්මියලා, එතුමන්ලගෙ පැත්තෙන් තමයි අවධාරණය කරන්නේ සිංගප්පූරුවට යන්න කියලා. ඇත්තටම සිංගප්පූරු උසාවියට යන්න මේ විශේෂඥ කමිටුවත් එකඟවෙච්චි බවක් තමයි අඟවලා තිබුණේ, කියලා තිබුණේ. ඒක සම්පූර්ණයෙන් අසත්‍යයක්. විශේෂඥ කමිටුව කිසිසේත්ම එකඟවෙලා නැහැ. මේ විශේෂඥ කමිටුවේ වාර්තාව මේ පාර්ලිමේන්තුවේ සභාගත කරන්න. එතකොට රටේ ජනතාවට විශේෂඥ කමිටුවේ ඇත්ත අදහස දැනගන්න පුළුවන්. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා ඒ වාර්තාව වහාම පාර්ලිමේන්තු සභාගත කරන්න.

සිංගප්පූරු බේරුම්කරණයට ගියාම වෙන්නේ පුළුවන් අවාසිය තමයි අපි බලාපොරොත්තුවන ඩොලර් බිලියන 6.4ක අපිට ලැබිය යුතු වන්දිය ලබාගන්න බැරිවෙන එක. මිලියන 26ක් වගේ සොච්චම් මුදලකට නඩුව කොහොම හරි අවසන් කරගන්න පුළුවන් වෙයි. පස්සේ ඇවිල්ල අපිට කියයි 'අපි දිනුවා හැබැයි ලැබෙන මුදල අඩුයි කියලා. එතකොට අවුරුදු තුන හතරක් ගිහිල්ලා. ඒවට උත්තර බඳින්නත් කවුරුවත් මෙතන නැතිවෙනවා. ඒ නිසා අපි අවධාරණය කරනවා...

(ඇමති කෙහෙළිර රඹුක්වැල්ල කතාවට බාධා කරමින් ප්‍රශ්නයක් අසයි)

ඇමති කෙහෙළිය රඹුක්වැල්ල - 'ඔබතුමා කියනවා සිංගප්පූවෙන් දෙන ප්‍රමාණය අඩුවෙයි කියලා. ලංකාවෙන් දෙන ප්‍රමාණය ඔය කියන ප්‍රමාණයට දෙනවයි කියන සහතිකේ මොකක්ද එහෙනම්?

(පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා නැවතත් අදහස් දක්වමින්)

ලංකාවෙ උසාවියේ මේ නඩුව දානකොට ඒ වන්දිය පිළිබඳ සීමාවක් නැහැ. සිංග ප්පූරු බේරුම්කරණයට යනකොට සීමාවක් තියෙනවා. අපි දැනුවත්ව සීමාවකට යටත් වෙනවා. එතකොට අනිවාර්යයෙන් අපිට ලැබෙන මුදල අඩුයි. ඒ නිසා වන්දි මුදල වැඩිකරගැනීමේ හැකියාව ලංකාවේ උසාවියේ තියෙනවා. නමුත් සිංගප්පූරු උසාවියේදී ඒක නැහැ. ඔික තමයි ප්‍රශ්නේ.

නැවත අපි මේ කරුණ ඉතිහාසයට එකතු කළොත්, අපිට මෙච්චර විශාල මුදලක් ඩොලර් බිලියන 6.4ක් කියන්නේ ලොකු මුදලක්. රටක් විදිහට ගත්තම ලොකු වාසියක්. මෙවැනි ආර්ථික අර්බුදයක අවපාතයක ඉන්න වෙලාවේ ඒ මුදල අපිට නැතිවෙනවා.

මේ X-Press Pearl නෞකාව ගැන ගොඩක් අය කතා කළා, මීට පෙරාතුව New Diamond නෞකාවේ සිද්ධිය ඇති වුණේ 2020 අවුරුද්දෙ. මීට අවුරුදු 03කට කලින්. ඒ



නෞකාවට අදාළවත් වන්දි මුදල් ලබා ගැනීමේදී 2022 ජනවාරි සහ මැයි මාස අතරතුර ඩොලර් මිලියන 05ක මුදලක් ජර්මන් ඩොයිෂ් බැංකුව මගින් සිංගප්පූරු ස්මිත් සමාගම වෙනුවෙන් ලංකාවේ ගැක් ෂිපින් කලම්බු කියන ආයතනය සතුව තිබෙන යූනියන් බැංකුවේ ගිණුමට ඇවිල්ලා තිබෙනවා. එතකොට ඒ මුදලට මොකද වුණේ? ඒ ඩොලර් මිලියන 05 එතනින් පස්සේ පිටරටට යනවා. එතකොට එදා නිව් ඩයමන්ඩ් නෞකාව වෙනුවෙන් වන්දි විදිහට අපිට ලැබ්ච්ච ඩොලර් මිලියන 05ක මුදල යූනියන් බැංකුවේ ගිණුමට ලැබිලා - සම්පූර්ණ වන්දි මුදල නෙවෙයි. ඒකෙ මූලික කටයුත්තක් සඳහා ලැබිච්ච වන්දි මුදල - ඒ මුදල නැවත පිටරටට ගිහිල්ල තියෙනවා. ඒක කොහොමද වුණේ? ඒ පිළිබඳවත් වාර්තාවත් මේ සභාවට ඉදිරිපත් කරන්න.

මොකද X-Press Pearl නෞකාව තමයි අද ගිනි අරගෙන සාකච්ඡාවට ලක්වෙලා තියෙන්නේ. හැබැයි New Diamond නෞකාවේ ඒ වෙච්චි ගනුදෙනුවත් තාම අභිරහසක් විදිහට තියෙනවා. මට මතකයි මීට වසර කිහිපයකට පෙර නැනෝ නයිට්‍රජන් පොහොර ලංකාවට ගෙනෙන වෙලාවෙදිත් මේ විදිහෙම අයථා ගනුදෙනුවක් වුණා. මම මේ පාර්ලිමේන්තුවේ පැහැදිලිවම බැංකු ගිණුම් සහිතව පුද්ගල නම් ගම් සහිතව හෙළිදරව් කළා. එදා ආණ්ඩුව උත්තර දුන්නා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු වහාම පරීක්ෂණයක් පවත්වනවා. ඒ වාර්තාව අනුව ඒ සියලු තොරතුරු මේ සභාවට ඉදිරිපත් කරනවා කියලා. නමුත් අද වෙනකන් නැහැ. නැනෝ නයිට්‍රජන් පොහොර සම්බන්ධයෙන් පුද්ගලික ගිණුමකට මුදල් තැන්පත් කළේ කොහොමද? ඒ පුද්ගලයො දෙන්නව තෝරගත්තෙ කොහොමද? ඒ සල්ලිවලට වෙච්ච දේ මොකක්ද? කියලා අද වෙනතුරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්තාව ඉදිරිපත් වෙලා නැහැ. ඒ සන්තෑසියම මේකටත් වෙන්න පුළුවන්.

හරි පහසුවෙන් මේක හොයාගන්න පුළුවන්නේ. දැන් චාමර ගුණසේකරගේ ගිණුමට X-Press Pearl නෞකාව වෙනුවෙන් ඩොලර් මිලියන 250ක් ගියානම්, ඩොලර් මිලියන 250ක් කියන්නේ රුපියල් බිලියන 80ක් හා සමාන මුදලක්. රුපියල් බිලියන 08ක් නැහැ කියල තමයි පළාත් පාලන ඡන්දෙ කල් දාලා තියෙන්නේ. මේ වෙලාවේ රුපියල් බිලියන 80ක් කියන්නේ ඡන්ද 10ක් පවත්වන්න පුළුවන්. රුපියල් බිලියන 80ක් අපිට ලැබෙන්න තියෙන එකක්. අද අපි රටක් විදිහට වංචාවකට ලක්කරලා තියෙනවා.

දැන් පැහැදිලිව අධිකරණ කැබිනට් ඇමතිවරයාම කියනවා අහවල් ගිණුමට ගියා කියලා. වහාම පරීක්ෂණය පවත්වලා වාර්තාව ඉදිරිපත් කරන්න. මේකට තේරීම් කාරක සභා පත් කරකර තවත් කල් අදිනකොට තොරතුරු එන්නේ පෙරහැර ගියාට පස්සේ. ඒක නිසා එදා නැනෝ පොහාරවලට වෙච්ච වැඩේ මේකට වෙන්න දෙන්න එපා. මේ New Diamond නෞකාව වෙනුවෙන් ලැබුණු ඩොලර් මිලියන 05 කොහෙටද ගියේ කියන එකත් වහාම පරීක්ෂණයක් කරලා මේ සභාවට ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

> ලංකාවෙ උසාවියේ මේ නඩුව දානකොට ඒ වන්දිය පිළිබඳ සීමාවක් නැහැ. සිංගප්පූරු බේරුම්කරණයට යනකොට සීමාවක් තියෙනවා. අපි දැනුවත්ව සීමාවකට යටත් වෙනවා. එතකොට අනිවාර්යයෙන් අපිට ලැබෙන මුදල අඩුයි. ඒ නිසා වන්දි මුදල වැඩිකරගැනීමේ හැකියාව ලංකාවේ උසාවියේ තියෙනවා. නමුත් සිංගප්පූරු උසාවියේදී ඒක නැහැ. ඕක තමයි ප්‍රශ්නේ.

## කඩා වැටුණු රට...

09 වැනි පිටුවෙන්

කරනවා. පාර්ලිමේන්තුවේ කොප් කමිටුවටවත් මහ බැංකුව කැඳවීමේ බලයක් නැහැ. මහ බැංකුව යනු මූල්‍ය වෙළඳපොළ නියාමනය කිරීමට තිබෙන ආයතනයක්. මහ බැංකුව ස්වාධීන කිරීමෙන් පෙරළා අපේ අනෙකුත් අංශ විශාල ලෙස දුර්වලභාවයකට පත්කරනවා. අවස්ථාවක භාණ්ඩාගාරයත්, මහ බැංකුවත් ඒකාබද්ධ සැලැස්මකින් මේ ව්‍යසනයෙන් ගොඩඑන්න ඕනෙ. මෙය අපේ රටේ දැවැන්ත අර්බුදයක් නිර්මාණය කරන්නක් වෙනවා.

ආණ්ඩුවේ ප්‍රධාන සංවිධායකකමේ අධිකරණයෙන් දූෂිතයෙකු ලෙස චෝදනාවට ලක්වූ අයෙකු තබාගෙන රනිල් වික්‍රමසිංහ දූෂණ විරෝධී පනතක් ගෙනවිත් තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ නීතිය තුළ නෙමෙයි. රනිල් මහ බැංකු හොරා බව පාර්ලිමේන්තුවේදී කිවේ වත්මන් අගමැති දිනේෂ් ගුණවර්ධනයි. ඒ මහ බැංකුව කොල්ලකාපු අය දූෂණ විරෝධී පනතක් ගේනවා කීම විහිළුවක්. තිබෙන නීති ඕනෑවටත් වඩා ප්‍රමාණවත්.

### රට ගොඩනඟන මඟ

මේ ගිවිසුම අසාර්ථක විය හැකි ප්‍රධාන හේතුවක් නම් විකිණීමේදී ඇතිවිය හැකි දූෂණයි. ආර්ථික වශයෙන් උපායමාර්ගිකව වැදගත් ව්‍යාපාර. ටෙලිකොම්, වරාය, තෙල් සංස්ථාව, විදුලි බල මණ්ඩලය, මූල්‍ය වෙළඳපොළ, බැංකු පද්ධතිය, ආර්ථිකයට අතිශය සංවේදී, ආරක්ෂාවටත් අතිශය සංවේදී ඒවා රජය විසින් කොටසක් තබා ගත යුතුමයි. අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහන වැනි සේවාවන් මේවා ලාභ ලබන ව්‍යාපාරයන් නොවේ. ඒවා භාණ්ඩාගාරය විසින් වියදම් දරා ජනතාවට සේවාවන් ලබාදිය යුතුයි. අධ්‍යාපනය ලාභ අලාභ ගිණුමක මැනිය නොහැකියි. කෙනෙක් නිරෝගී සම්පන්නව ජීවත් වීම ලාභ අලාභ ගිණුමේ මැනිය හැකිද? සෞඛ්‍ය, ප්‍රවාහනය, ලාභද පාඩු ද බැලීම නිවැරදි ක්‍රියාවක් නෙමෙයි. එම ආයතන කළමනාකරණය සඳහා රජය මැදිහත් විය යුතුයි.

අපේ සැලැස්ම නිෂ්පාදනය දිරි ගැන්වීමයි. අපේ ආර්ථිකය කඩා වැටී තිබෙනවා. ඒ නිසා නිෂ්පාදනය නඟා සිටුවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීමට අපි ණය ගැනීමට සූදානම්. ආයෝජනවලට සුදුසු රටක් අපි හදන්න ඕනෑ. ආර්ථික උපායමාර්ගිකව ආයෝජනය අවශ්‍යයි. වෘත්තීමය නිපුනතාවයක් සහිත ශ්‍රම බලකායක් හැදීම අපේ තවත් එක් උපායමාර්ග යක්. අපි අයි.ටී. තාක්ෂණය පුළුල් කිරීමට බලාපොරොත්තු වෙනවා. නිෂ්පාදනයට ජනතාව හවුල් විය යුතුයි. ආර්ථිකය ගමට ප්‍රසාරණය විය යුතුයි. වෙළඳපොළ කළමනාකරණය කළ යුතුයි. සමහර භාණ්ඩ තරගකාරීත්වයකින්ද, නියාමනයකින්ද, වෙළඳපොළේ පංගුවක් අත්පත් කර ගැනීමෙන්ද, සංවිධානය කිරීමෙන්ද පාලනය විය යුතුයි. නිෂ්පාදනය දියුණු කර, වෙළඳපොළ සමනය කරනවා. ජනතාවට ප්‍රතිලාභ ගලාගෙන යන ආර්ථිකයක් අපි හදනවා. අල්ලස, දූෂණ, නාස්තිය නතර කළ යුතුයි. මේ කඩා වැටුණු රට අපි ගොඩනඟනවා. ඒ වෙනුවෙන් ආර්ථිකයේ, දේශපාලනයේ, සමාජයේ, රාජ්‍ය සේවයේ නව පරිවර්තනයක් අවශ්‍යයි. නවීන ලෝකයක් එක්ක සම්බන්ධ වුණු රාජ්‍යයක් අපි ගොඩනඟන්න ඕනෑ. ලෝකයේ දියුණුම රාජ්‍යයක් බවට අපි ශ්‍රී ලංකාව පත් කළ යුතුයි.

## රනිල්ගේ IMF සිහිනය...

07වැනි පිටුවෙන්

බහුපාර්ශවීය ණය මගිනි. ඩොලර් මිලියන 950ක් විදේශ ආයෝජන මගිනි. (2024 දී එය ඩොලර් මිලියන 1280 කි) පෞද්ගලික අංශයද ඩොලර් මිලියන 900ක් ණය ගත යුතුයි. එසේම IMF මගින් ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකුවෙන් ලබාදෙන ඩොලර් මිලියන 900ටද අමතර ණය සහනයක් (කපා ගැනීමක් හෝ කල් ගැනීමක්) ලෙස ඩොලර් මිලියන 3,376ක් ආණ්ඩුව ගෙවීමට ඇති ණයවලින් අඩු කරගත යුතුය.

රනිල් වික්‍රමසිංහ බලලෝභය සඳහා වැල් පාලමේ යන්නේ එලෙසය. මෙම ඉලක්ක සපුරා ගැනීම පහසු නැත. ආර්ථික දේහයට ඇති විය හැකි තුවාල මාරාන්තිකය.

## අපි එකතු කරමින් ඉන්නේ...

12 වැනි පිටුවෙන්

තිබුණා. "හොඳ දෙයක් වෙනුවට හොඳ දෙයක් දෙන්න කාටත් ලේසියි. එහෙත් නරක දෙයක් වෙනුවට හොඳ දෙයක් දෙන්න හැකියාව තිබෙන්නේ ධෛර්යය සම්පන්න මිනිසුන්ට" අපිට සිදුවී තිබෙන්නේ විනාශ කළ, නරක රටක් වෙනුවට හොඳ රටක් හදන්න. ඒ සඳහා අධිෂ්ඨානශීලී, නිර්මාණශීලී, ධෛර්යය සම්පන්න මිනිසුන් ඕනෑ. ආත්මාර්ථකාමී නොවන පොදු අරමුණු වෙනුවෙන් වැඩකරන මිනිසුන්ගෙන් සමන්විත ව්‍යාපාරයක් ඕනෑ. මේ රට ගොඩනගලා මිනිසුන් සතුටින් ඉන්නවා දැක හිනාවෙන්න හැකි සමාජයක් අපි ගොඩනගන්න ඕනෑ. අපි කවුරුත් එකතු වෙලා ශක්තිය අරගෙන ධෛර්යය අරගෙන අපි ගම්වලට ගිහින් මේ ව්‍යාපාරය ඉතා ඉක්මනින් බලය ගන්න තැනට ගේන්න ඕනෑ. අපි හැමෝම එකතුවෙලා ඉතිහාසය අලුතින් ලියන්න එකතු වෙමු කියලා ආරාධනා කරනවා."

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


## රතු මැයි පෙළපාලියේ විශේෂ අවස්ථා...
















## රතු මැයි රැලි වේදිකාවෙන්..

# රටේ අනාගතය නිර්මාණය කිරීමේ වගකීම අපේ දෙවුර මත පැටවී තිබෙනවා

### ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා



පවතින මෙහොතේ දේශපාලන තීන්දු තීරණ ගැනීම අතිශයින්ම තීරණාත්මක බවත් කලබලයට, හැඟීමට යටත් වී සතුරා කපන බොරු වළට වැටෙන්නට හෝ මරුවැල පාගා ගැනීමට අයිතියක් නොමැති බවත් අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා, රටේ ජනතාව කෙරෙහි තමන්ට වගකීමක් ඇති බවත් රටේ ජනතාව පිළිබඳ වගකීම මේ ව්‍යාපාරය අතට ඇවිත් තිබෙන බවත් අනාගතය නිර්මාණය කිරීමේ වගකීම සියලු දෙනාගේ දෙවුර මත පැටවී තිබෙන බවත් ප්‍රකාශ කළේය.

අනුර දිසානායක සහෝදරයා මෙසේ පැවසුවේ, මැයි 01වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ රතු මැයි රැලිය අමතමිනි. මෙහිදී අනුර දිසානායක සහෝදරයා වැඩිදුරටත් මෙසේද ප්‍රකාශ කළේය.

" අපි දීර්ඝ කාලයක් මේ දේශපාලනයේ යෙදුනා. ඒ කාලය තුළ ජයග්‍රහණ මෙන්ම පසුබෑම් තිබුණා. අපි ඉතාමත් අසීරුතම අවදීන් ගත කළා. එහෙත් අපි කිසිසේත් අත්හරින්නේ නැති විශ්වාසයක් තිබෙනවා. එදා රෝහණ විජේවීර සහෝදරයා කියා දුන් "ඊයේ අපට ඇහුම්කන් නොදුන් කන් අද ඇහුම්කන් දෙනවා. අද ඇහුම්කන් නොදෙන කන් හෙට ඇහුම්කන් දෙනවා" මේ වන විට රටේ සාතිශය බහුතර ජනතාවක් අපට ඇහුම්කන් දෙනවා. ඒ වගේම විශ්වාසය තබා තිබෙනවා. අසීරුම කාලයේ පසු නොබැස ධෛර්යය සම්පන්නව අපි ඒ වචන විශ්වාස කළා. අද අපේ ඇස් ඉදිරියේ ඒ තත්වය විද්‍යාමාන වෙමින් තිබෙනවා.

කඩා වට්ටවන ලද රාජ්‍යය ගොඩනැගීමේ වගකීම අපට පැවරී තිබෙනවා. ලෝකයේ පිළිගන්නා රටක් බවට රට ගොඩනැගීමේ වගකීම අපට තිබෙනවා. මේ රටේ සියලු ජනතාවගේ බලාපොරොත්තුව සහ සිහිනය බිඳවැටෙන්න ඉඩ නොදී ජයග්‍රහණය කරා සූක්ෂමව මෙහෙය විය යුතුයි. එදා ඔවුන් ආණ්ඩු කළ අතර, කුඩා කණ්ඩායමක් ලෙස අපි බලපෑම් කළා. ඒ ඉතිහාසයේ සටන අද මේ රට නැති බංගස්ථාන කරපු පැලැන්තියෙන් පොදු ජනයා අතට බලය ලබාගැනීමේ අරගලයට පැමිණ තිබෙනවා. මෙතෙක් අපි කළ හැම සටනකටම වඩා තීරණාත්මක සටනක්, මෙතෙක් කළ දේශපාලනයට වඩා තීරණාත්මක දේශපාලනයක් අපි හැමදෙනාම අවදියෙන්, බුද්ධියෙන්, කල්පනාවෙන් සූක්ෂමව කළ යුතු වෙනවා. ජනතාවගේ ප්‍රාර්ථනා බිඳවැටීමට නොදී මේ යාත්‍රාව ජයග්‍රහණය කරා ගෙනයාම වෙනුවෙන් ඒකරාශී වී සිටින හැමදෙනාම තව තවත් ජනතාව සංවිධානය කරමින් හැමදෙනාගේම මුව මුව නැගෙන හඬ බවට පත් කළ යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් සියලු දෙනාම ඒකරාශී වී කටයුතු කරමු කියා ආරාධනා කරනවා."

# අපි එකතු කරමින් ඉන්නේ විනයක්, අරමුණක්, දැක්මක් සහිත දැවැන්ත ජනතා බලයක්

### ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



දේශපාලන ව්‍යාපාරයක් ලෙස තමන් එකතු කරමින් ඉන්නේ අරමුණෙන් වැඩ කරන, විනයක්, අරමුණක්, දැක්මක් සහිත දැවැන්ත ජනතාවගේ බලයක් බව ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, මැයි දින වේදිකාව අබියස තිබෙන්නේ එම බලය බවත් එය කුඩා ඡන්දයක් කල්දැමීමෙන් වෙනස් කළ හැකි බලයක් නොවන බවත් එසේ සිතාගෙන සිතීම වැරදීමක් බවක් බවත් අවධාරණය කළේය.

"දැන් අපට තිබෙන්නේ අපේ ජයග්‍රහණය නිල ලෙස වාර්තා කර ගැනීමයි. ඒ වෙනුවෙන් විශාල කාර්යභාරයක් අපට තිබෙනවා. මේ වගේ ලෝකයක, කොල්ලකාරී විවෘත ආර්ථිකයක, නව ලිබරල්වාදී ක්‍රමයක, තමන්ගේ ජන මාධ්‍ය මෙහෙයවලා ජනතාවගේ මනස විකෘති කරද්දී ජනතා විමුක්ති පෙරමුණට, ජාතික ජන බලවේගයට විරුද්ධව එහි නායකයන්ට විරුද්ධව බොරු අවලාද නගද්දී දුෂ්කර කොන්දේසි මැද මෙවැනි බලවේග යක් ගොඩනැගීමෙන් අතිශය දුෂ්කර කාර්යය අපි සියලු දෙනා විසින් ඉටුකර තිබෙනවා. ලෝකයේ ගොඩක් රටවල වමේ ව්‍යාපාරවලට මේ තත්වයට ළඟා වීමට බැරිවී තිබෙනවා. ධනවාදය පිරිහී අර්බුද විශාල වී තිබුණත් ලෝකයේ බොහෝ රටවලට මේ වගේ තැනකට එන්න බැරිවී තිබෙනවා. නමුත් අපේ රටේ ධනවාදී සියලු කණ්ඩායම් එක තැනක තබා, පාලක සියලු කණ්ඩායම් එක තැනක තබා අභියෝග කරන්න අපට හැකිවී තිබෙනවා. හෙට දවසේදී ලෝකය පුරා ආදර්ශයට ගන්නා ව්‍යාපාරයක් හැටියට පිළිගන්න පුළුවන්.

මහජනතාව සමග එකතු වෙලා මේ බලය අතට ගන්නත් ඕනෑ. ඒ සඳහා දැවැන්ත මහජන ව්‍යාපාරයක්, මහජන බලයක්, අපට ඕනෑ. සතුරු කණ්ඩායම් පරාජයට පත්කර අපි අතට බලය ගත හැකි තරම් මේ ව්‍යාපාරය පුළුල් කරන්න ඕනෑ. මේ කණ්ඩායම් පරාජය කර අපි ජනතාවාදී පාලනයක් පිහිටුවන්නත් ඕනෑ. ජනතාවාදී ආණ්ඩුවක් හදලා විතරක් වැඩක් නැහැ. ඒ ආණ්ඩුව එක්ක අත්වැල් බැඳගෙන දැන් වට්ටවා තිබෙන රට ගොඩගන්න ඕනෑ. රට ගොඩනැගීම ලෙහෙසි පහසු වැඩක් නොවන බව අපි දන්නවා. නිෂ්පාදන මාර්ග බිඳවට්ටවා, මනුෂ්‍යත්මය බිඳ වට්ටවා ස්වභාවික සම්පත් අකාමකා දැමූ රටක් ගොඩගැනීමට අධිෂ්ඨාන සහගත මිනිසුන් ඕනෑ.

රෝහණ සහෝදරයා නිතර කියන රුසියානු කියමනක් // වැනි පිටුවට

# දැන් රටට අවශ්‍ය පොදු ජන අරගලයක්

### ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා



සමස්ත ආර්ථික දේහයත් ඒ හා බැඳුණු වැඩකරන පංතියත් පමණක් නොව සේවා පාර්ශ්වයත් දැවැන්තම සමාජ ආර්ථික අර්බුදයක් හමුවේ සිටින බවත් වැඩිම වැටුප් ගන්නා පිරිසත් අයුක්තිසහගත බදු පීඩනයකට ලක්කර තිබෙන බවත් මේ තත්වය තුළ සියලුම දෙනාට අරගලයක් තිබෙන බවත් පෙන්වා දුන් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා, පීඩනය හමුවේ වැඩවර්ජනය විසඳුමක් වූ නමුත් මේ මොහොතේ අවශ්‍ය වන්නේ, වෘත්තීය සමිති සටනක් නොව සියලු ජනයා සම්බන්ධ කරගත් අරගලයක් බව අවධාරණය කළේය.

"අපි මේ මැයි දිනය සමරන විට මේ රටේ වැඩකරන ජනතාව ප්‍රමුඛ ප්‍රගතිශීලී ජනතාවගේ ජන මතය හමුවේ 75 වසරක් රට පාලනය කළ කොල්ලකාරී නඩය පලා යමින් සිටින සුවිශේෂ ඓතිහාසික දේශපාලන වටපිටාවක් නිර්මාණය වී තිබෙනවා. මාර්තු 09දා පළාත් පාලන ඡන්දය නොපවත්වා පලා ගියේ ඔවුන්. 75 වසරක් මේ රට කාපු පාලක නඩයෙන් රට මුදා ගන්න වුවමනායි කියලා ගොඩනැගූ ජනමතය හමුවේ මේ පාලකයෝ පලා යනවා. මැතිවරණයක් හමුවේ මේ රටේ පාලකයන් මේ ආකාරයට පලා යන පළමුවෙනි මොහොත උදාවී තිබෙනවා. ලාංකේය ජනතාව මීට කලින් එහෙම අවස්ථාවක් දැක නැහැ. ආර්ථික වශයෙන් රට මුළුමනින්ම කඩා වැටී ඇති බව, මුළු සමාජයම පිරිහී කඩා වැටී ඇති බව අමුතුවෙන් කියන්න ඕන නැහැ. ජාතික ජන බලවේගයත් ප්‍රගතිශීලී ජනතාවත් හැර අනෙකුත් සියලුම පක්ෂ සහ දේශපාලන ව්‍යාපාර සී සී කැඩී බිඳී ගොස් ඉවරයි. මේ රට මෙතෙක් ඉතිහාසයේ නොවූ විරූ වෙනස්ම තැනක තිබෙන්නේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අණපනත් එකක් වත් ඔවුන්ගේ බලය රැකගෙන පවතින්න ප්‍රමාණවත් නැහැ. රටක හැමදාම මේ තත්වයක් ඇති වෙන්නේ නැහැ. පවතින තත්වයන් යටතේ පාලකයන්ට තවදුරටත් පවතින්න බැරිවෙන තත්වයට මේ රටේ ප්‍රගතිශීලී ජනයා, පීඩිත ජනයා හැමපැත්තෙන්ම නැගී සිටිනවා. අපි මේ මැයි දිනය සමරන්නේ ඒවගේ වටපිටාවකයි."


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.